# ජීවිතය සඳහා තාක්ෂණවේදය

පළමු වාරය

## ගුරු මාර්ගෝපදේශය

## 6 ශ්‍රේණිය

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
**www.nie.ac.lk**
මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ජීවිතය සඳහා තාක්ෂණවේදය**
**ගුරු මාර්ගෝපදේශය**
**6 ශ්‍රේණිය**
**පළමු වාරය**

ප්‍රථම මුද්‍රණය - 2025
ISBN

© ජාතික අධ්‍යාපන ආයතනය
ප්‍රකාශනය : ජාතික අධ්‍යාපන ආයතනය

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
විද්‍යා හා තාක්ෂණ පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය,
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය - www.nie.ac.lk
විද්‍යුත් තැපැල - Info@nie.lk

මුද්‍රණය- මුද්‍රණාලය,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

## උපදේශනය, රචනය හා සංස්කරණය

**උපදේශකත්වය** : මහාචාර්ය මංජුලා විතානපතිරණ (PhD),
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය.

කේ. රංජිත් පත්මසිරි මයා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපන පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය.

**අධීක්ෂණය** : ආචාර්ය කේ. ජී. වසන්ත කටුකුරුන්ද මයා,
අධ්‍යක්ෂ,
තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය** : ජී. ආර්. පී. එම්. සමරනායක මිය,
සහකාර කථිකාචාර්ය,
තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**ලේඛක මණ්ඩලය** : තිසරදිනී හිරිමුතුගොඩ මිය - ගුරු සේවය(විශ්‍රාමික), බප/ශ්‍රී ජය/
ආනන්ද බාලිකා විදුහල, කෝට්ටේ.
ඉංජිනේරු නිමන්ත දසනායක මයා - කථිකාචාර්ය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
ආචාර්ය ඉංජිනේරු අකිලා විජේතුංග මිය - කථිකාචාර්ය,
තාක්ෂණ පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**සංස්කරණය** :

**අභ්‍යන්තර** : ජී.ආර්.පී.එම්. සමරනායක මිය, සහකාර කථිකාචාර්ය,
තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**බාහිර** :

ආචාර්ය ජූලියන් නානායක්කාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික),
කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශය, විද්‍යා පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය,

කේ. එම්. ජී. එන්. ටී. ඩයස් මෙනවිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

කේ. ඩබ්. කේ. ඩී. කරවිට මයා - ගුරු සේවය, බප/ හෝ/ හංවැල්ල රාජසිංහ ජාතික පාසල,
හංවැල්ල.

ඒ. සෙල්වම් මයා - කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික), කලාප අධ්‍යාපන
කාර්යාලය, හැටන්.

ආර්. ඒ. චානක කුමාර මයා - ගුරු සේවය, බ/කහගොල්ල ජාතික පාසල, දියතලාව.

පී. ඩී. එල්. කුමාරසිරි මයා - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල.

රසික සම්පත් එදිරිසිංහ මයා - ගුරු සේවය, මාර/සිද්ධාර්ථ විද්‍යාලය, වැලිගම.

**භාෂා සංස්කරණය** : මේනක තරංග ප්‍රේමචන්ද්‍ර, ගුරු සේවය, නු/ ශාන්ත ගේබ්‍රියෙල්
බාලිකා ජාතික පාසල, හැටන්.

**පරිගණක පිටු සැකසුම** : තිසරදිනී හිරිමුතුගොඩ මිය, ගුරු සේවය(විශ්‍රාමික) බප/ශ්‍රී ජය/
ආනන්ද බාලිකා විදුහල, කෝට්ටේ.

**පිටකවරය සැකසුම** : රසික සම්පත් එදිරිසිංහ මයා, ගුරු සේවය, මාර/සිද්ධාර්ථ
විද්‍යාලය, වැලිගම.

# හැඳින්වීම

තාක්ෂණය අර්ථ දක්වා ඇත්තේ මානව අවශ්‍යතා සපුරාලන නිෂ්පාදන හා ක්‍රියාවලින් නිර්මාණය සඳහා අවශ්‍ය දැනුම, පළපුරුද්ද සහ සම්පත් යෙදවීම ලෙස යි. අර්ථවත් ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම සඳහා සිසුනට අවස්ථා ලබා දීමේ වැදගත්කම මෙමගින් අවධාරණය වේ. මෙම ඉගෙනුම් අත්දැකීම්වල දී ද්‍රව්‍ය, මෙවලම්, යන්ත්‍ර සහ පද්ධති පිළිබඳ ඔවුන්ගේ දැනුම ලබා ගැනීමට මෙන් ම විවිධ තොරතුරු රැස් කිරීමට සහ භාවිත කිරීමට ඔවුනට හැකියාව ලැබේ.

21 වැනි සියවස ආරම්භයත් සමග තාක්ෂණය අපගේ ජීවිතයේ අනිවාර්ය අංගයක් බවට පත් ව ඇත. ලෝකය ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින අතර, නව තාක්ෂණය රටක ආර්ථික හා සමාජ සන්දර්භයට දැඩි ලෙස බලපානු ඇත. නිවසේ දී, ප්‍රජාව තුළ සහ ලොව පුරා ධනාත්මක ආකල්පයක් සහිත ව දෛනික ගැටලු විසඳීමට ද යහපැවැත්ම සඳහා නව විසඳුම්, නිෂ්පාදන සහ සේවාවන් නිර්මාණය කිරීම සඳහා ද තාක්ෂණය ඵලදායී හා නම්‍යශීලී ව භාවිත කිරීමට මිනිසුන් සන්නද්ධ විය යුතු වේ.

තාක්ෂණික සාක්ෂරතාව (Technology Literacy) යනු තාක්ෂණය භාවිත කිරීමට, කළමනාකරණය කිරීමට, තක්සේරු කිරීමට හා තේරුම් ගැනීමට ඇති හැකියාව ලෙස ජාත්‍යන්තර තාක්ෂණ අධ්‍යාපන සංගමය (ITEA) අර්ථ දක්වා ඇත. තාක්ෂණික සාක්ෂරතාවේ සමස්ත පරමාර්ථය විය යුත්තේ ජාතියේ වර්තමාන හා නැගී එන ආර්ථික හා සමාජ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වන තාක්ෂණික කුසලතා වර්ධනය කිරීම හා එමගින් සිසුනට ඔවුන්ගේ අනාගත රැකියා සහ ජීවිතයේ වෙනත් අංශයන්හි උපරිම නම්‍යශීලී බවක් හා අනුවර්තනය වීමේ හැකියාවක් ලබා දීමයි. ශ්‍රී ලංකාවේ කුසලතා ඉල්ලුම හා සැපයීම අතර නොගැළපීමක් ඇති අතර එමගින් විරැකියාව හා අකාර්යක්ෂම සේවකයින් පිරිසක් බිහි වීම සිදු වේ. කුසලතා ඉල්ලුමට ගැළපෙන සැපයුමක් මෙන් ජාතික සංවර්ධනය හා තරගකාරිත්වය, ව්‍යාපාරවල ඵලදායිතාව සහ සේවක යහපැවැත්ම ප්‍රවර්ධනය කළ හැකි වේ.

මේ අනුව සාමාන්‍ය අධ්‍යාපනයෙන් සිසුනට නව දැනුම, ආකල්ප සහ කුසලතා යාවත්කාලීන ව ලබා දිය යුතු අතර ඒ හා සමාන ව මෙම සැපයුම හා ඉල්ලුම අතර පරතරය පිරවීම සඳහා ධනාත්මක මානසිකත්වයක් වර්ධනය කළ යුතු ය.

6-13 ශ්‍රේණි සඳහා වන නව තාක්ෂණ විෂයමාලාව සම්පාදනය කිරීමේ දී 21 වැනි සියවසෙහි කුසලතා කෙරෙහි හොඳින් අවධානය යොමු කර ඇත. එමෙන් ම ශ්‍රී ලංකාවේ ඉල්ලුමට මෙන් ම ගෝලීය ආර්ථිකයට අදාළ ව ද විවිධ කුසලතා සිසුන් විසින් වර්ධනය කර ගැනීම වැදගත් වේ. මේ අනුව 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා ඒකාබද්ධ තාක්ෂණ විෂයක් හඳුන්වා දී ඇති අතර විවිධ අංශවලට අදාළ කුසලතා සංවර්ධනය කිරීම සඳහා එය වැදගත් වේ. 9 ශ්‍රේණිය අවසානයේ දී සිසුනට 10 සහ 11 ශ්‍රේණි සඳහා ඔවුන්ගේ සුවිශේෂ විෂය ක්ෂේත්‍රවල අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. ජාතික අධ්‍යාපන අභිමතාර්ථ, 21 වැනි සියවසට අදාළ කුසලතා, සිව් වැනි කාර්මික විප්ලවය සහ දේශීය හා කලාපීය සන්දර්භය පදනම් කර ගත් තාක්ෂණයේ වැදගත් අංශ කිහිපයක් තාක්ෂණ විෂයමාලාවට ඇතුළත් කර ඇත.

******** සටහන**

මෙම විෂයට අදාළ ව මොඩියුල හා ඊට අදාළ ගුරු අත්පොත් සකස් කිරීමේ දී අන්තර්ජාල වෙබ් අඩවි හා විවිධ ග්‍රන්ථ, ලිපි ලේඛන පරිශීලනයෙන් තොරතුරු, රූප සටහන් මෙන් ම වැඩි දුර පරිශීලනය සඳහා YouTube හා සබැඳි QR කේත ද ඇතුළත් කර ඇත. එම බුද්ධිමය දේපළවල හිමිකාරීත්වයට සමස්ත අධ්‍යාපන පද්ධතිය වෙනුවෙන් අපගේ ගෞරවනීය ස්තුතිය පුද කරනු ලැබේ.

# පටුන



- උපදේශනය, රචනය හා සංස්කරණය....................iii
- හැඳින්වීම....................iv
- පටුන ....................v

1. විසි එක්වැනි සියවසේ අධ්‍යාපනයට පියනගමු ....................01
2. ජීවිතය සඳහා තාක්ෂණවේදය....................02
3. මොඩියුල ක්‍රියාත්මක කිරීම සඳහා පොදු උපදෙස් මාලාව
   - 3.1 ගුරු භවතුන් දැනුවත් වීමට....................04
   - 3.2 මව්පියවරුන් හා වැඩිහිටියන් දැනුවත් කිරීමට උපදෙස්....................05
4. මොඩියුලයේ අන්තර්ගත ක්‍රියාකාරකම්වලට අදාළ වන පූර්ව උපදෙස්
   - 4.1 සිසුන් දැනුවත් කිරීමට උපදෙස් ....................06
   - 4.2 ගුරු භවතුන් දැනුවත් වීමට....................07
5. පන්ති කාමරය තුළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීමක්..........08
6. තක්සේරුව සඳහා පොදු උපදෙස් ....................09
7. මොඩියුලය අවසානයේ මුළු ලකුණු ගණනය කිරීම.................... 11
8. මොඩියුල ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ උපදෙස්මාලාව සහ තක්සේරුව
   - 8.1 හරිත කෘෂි හුරුව - 1 - විෂය නිර්දේශය-....................13
   - 8.2 මොඩියුලය 1 - හරිත කෘෂි හුරුව - 1 ....................15
   - 8.3 මොඩියුලය 1 - ගුරු තක්සේරුව....................21
   - 8.4 මූලික තාක්ෂණ හුරුව - 1 - විෂය නිර්දේශය-....................24
   - 8.5 මොඩියුලය 2- මූලික තාක්ෂණ හුරුව - 1....................25
   - 8.6 මොඩියුලය 2 - ගුරු තක්සේරුව ....................31

# 1. විසි එක්වන සියවසේ අධ්‍යාපනයට පියනගමු

සාමාන්‍ය අධ්‍යාපනයේ දැක්ම වන්නේ විසි එක්වන සියවස හා ඉන් ඔබ්බෙහි වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි තිරසර ජාතික සංවර්ධනය හා තිරසර සාමය සඳහා සක්‍රීය ව දායක විය හැකි සාරධර්මවලින් හෙබි අනාගත පුරවැසියෙකු බිහි කිරීමයි. මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීමට 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත පාසල් විෂයමාලාව පහත දැක්වෙන (රූපය 01) සාමාන්‍ය අධ්‍යාපන අරමුණු හය පදනම් කරගෙන ඇත.

1. තිරසර ජාතික සංවර්ධනයට සක්‍රීය ව දායක වන පුද්ගලයකු බිහිකිරීම (An active contributor to sustainable national development )
2. ඵලදායී හා කාර්යක්ෂම වැඩ නැඹුරු පුරවැසියෙකු, සේවකයෙකු හෝ ස්වයං රැකියාලාභියෙකු බිහිකිරීම (An effective and efficient work-oriented citizen employee or self employee )
3. ව්‍යවසායකයෙකු සහ/හෝ ව්‍යවසායකත්ව මනෝභාවයකින් යුතු පුරවැසියකු තැනීම (An entrepreneur and or a person with entrepreneurial mindset)
4. දේශප්‍රේමී පුරවැසියෙකු ගොඩනැගීම (A patriotic citizen)
5. යහපත් මිනිසකු නිර්මාණය කිරීම (A good human being)
6. ප්‍රීතිමත් පවුලක සාමාජිකයෙකු තැනීම (Member of a happy family)




රූපය 01

උක්ත සාමාන්‍ය අධ්‍යාපන අරමුණු හයට අමතර ව 21 වැනි සියවසේ දී ශිෂ්‍යයෙකු තුළ ප්‍රගුණ කළ යුතු පහත දැක්වෙන ක්ෂේත්‍ර කෙරෙහි ද මෙම විෂයමාලාව සම්පාදනය කිරීමේ දී අවධානය යොමු කර ඇත. ඉගෙනුම් කුසලතා (Learning Skills) හතරකි. එනම්,

1. සන්නිවේදනය (Communication)
2. සහයෝගීත්වය (Collaboration)
3. විචාරාත්මක චින්තනය (Critical thinking)
4. නිර්මාණශීලිත්වය (Creativity)

තෙවැදෑරුම් සාක්ෂරතා කුසලතා (Literacy Skills) පහත දැක්වේ.

1. තොරතුරු (Information) 2. මාධ්‍ය (Media) 3. තාක්ෂණවේදය (Technology)

ජීවන කුසලතා (Life Skills) යටතේ සංවර්ධනය කළ යුතු පෞරුෂ ගති ලක්ෂණ පහකි.

1. නම්‍යශීලී බව (Flexibility)
2. නායකත්වය (Leadership)
3. ආරම්මණ ශක්තිය (Initiativeness)
4. ඵලදායීතාව (Productivity)
5. සමාජශීලී බව (Sociability)

**චරිත සංවර්ධනය හා පුරවැසි අධ්‍යාපනයː** (Character Development and Citizenship Education) මෙමගින් අන් අයට ගරු කිරීම (Respect), වගකීම (Responsibility), ඍජු හා අවංක බව (Integrity), අන් අය කෙරෙහි සංවේදී වීම (Caring), දරා ගැනීම (Resilience ) හා සමගිය (Harmony) යනා දී ගුණාංග සිසුන් තුළ ප්‍රගුණ කිරීම සිදු කෙරේ. එසේ ම සමාජ හා චිත්තවේග ඉගෙනීම (Social and Emotional Learning) සහ සතිමත් බව (Mindfulness) සිසුන් තුළ ප්‍රගුණ කිරීම ද අපේක්ෂා කෙරේ.

## 2. ජීවිතය සඳහා තාක්ෂණවේදය (Technology for Life) (6-9 ශ්‍රේණි)

සෑම පුරවැසියෙකු ම තමන් නියැළී සිටින විෂය ක්ෂේත්‍රයේ බුද්ධිමත් පාරිභෝගිකයෙකු හෝ නිෂ්පාදකයෙකු වීමට නම් තාක්ෂණය පිළිබඳ ප්‍රමාණවත් දැනුම සහ කුසලතා තිබිය යුතු ය. මෙමගින් ආරම්භක විද්‍යාව, තාක්ෂණය සහ ව්‍යාපාර පිළිබඳ පසුබිම් දැනුමෙහි අවශ්‍යතාව ඇති කරයි. ජීවිතය සඳහා, තාක්ෂණය මගින් මෙම හැකියා ප්‍රායෝගික සහ සමෝධානිත ව ලබා දීම සිදු කරයි.

තව ද කාර්ය සහ ව්‍යාපාර ව්‍යවසාය මත පදනම් වූ ගෝලීය ප්‍රවණතාව හා බැඳුණු මූලික තාක්ෂණික ක්‍රියාකාරකම්වල නිරත වීමේ අවස්ථාවක්, මූලික තාක්ෂණික හුරුව මගින් ශිෂ්‍යයන්ට ලබා දෙයි. එමගින් ඔවුහු කර්මාන්ත ක්ෂේත්‍රය සහ එදිනෙදා ජීවිතයට අවශ්‍ය වන පොදු සහ මෘදු කුසලතා මෙන් ම නිහඬ දැනුම(Tacit knowledge) ද ලබා ගනිති. ශිෂ්‍යයින්ට සිය හැකියා සහ විභවතා හඳුනා ගැනීම සඳහා පරිපූර්ණ අධ්‍යාපනික අවස්ථාවක් ලබා දීමත් සමග ම, ගුරුවරයා විසින් මග පෙන්වනු ලබන වටිනා පාසල් පාදක අත්දැකීම් ගොන්නක් ලබා දීම ජීවිත සඳහා තාක්ෂණය හුරුව මගින් සිදු කෙරේ. මෙමගින් පෙරළා ඔවුන්ට ආත්ම විශ්වාසය සහ අනාගත ලෝකයට සරිලන කුසලතා දියුණු කර ගැනීමට අභිප්‍රේරණයක් ලබා දෙයි.

**විෂය අරමුණු**

1. උචිත ප්‍රායෝගික අවස්ථා සහ එම අවස්ථාවල නැගෙන ගැටලු සඳහා ක්‍රියාකාරී ලෙස විසඳුම් ඉදිරිපත් කිරීමෙහි නිරත වීම පිළිබඳ කුසලතා ලබා දීම
2. සමාජයෙන් ලබාගත හැකි අවිධිමත් අධ්‍යාපන අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් ස්වයං ගවේෂණයෙන් යාවජීව අධ්‍යාපනයට යොමු කිරීම
3. ද්‍රව්‍ය, ආවුද, උපකරණ සහ උපාංග නිසි පරිදි භාවිතය හා නඩත්තුව සඳහා එදිනෙදා අවශ්‍ය වන තාක්ෂණික කුසලතා ශිෂ්‍යයින් තුළ පෝෂණය කිරීම
4. ශීඝ්‍රයෙන් වෙනස් වන සාමාජීය සන්දර්භයක් තුළ තොරතුරු, තොරතුරු ලබා ගැනීම සහ සැකසීමෙහි වැදගත්කම පිළිබඳ අවබෝධය ගොඩනැගීම
5. ඉගෙනුමට ඉගෙනීම, සහජ හැකියා සංවර්ධනය හා සිය ආත්ම විශ්වාසය සංවර්ධනය කරන ආකාරය අධ්‍යයනය කරන අතරතුර, සිය අත්දැකීම් මගින් නවීකරණය සඳහා යොමු වීමට ශිෂ්‍යයින් අභිප්‍රේරණය කිරීම

6. සමාජ හා පාරිසරික ආචාරධර්මවලට ගරු කරමින් ජාතික සංවර්ධනයට දායක වන, ව්‍යවසායකත්ව කුසලතාවලින් සමන්විත පුද්ගලයෙකු ගොඩනැගීම
7. සමාජ වටිනාකම් හඳුනා ගෙන, ආකල්ප හා අත්දැකීම් ඵලදායි ලෙස හුවමාරු කරගනිමින් ස්වාධීන හා වගකීම් සහගත ලෙස ක්‍රියා කිරීමේ හැකියාව ශිෂ්‍යයන්ට ලබා දීම

## පරමාර්ථය

දැනුවත් පුරවැසියන් ලෙස සමාජයේ කටයුතු කිරීම සඳහා ශිෂ්‍යයන් තුළ පුළුල් තාක්ෂණික දැනුම, භාවිතය හා ආකල්ප වර්ධනය කිරීම සහ තාක්ෂණය පදනම් වූ විවිධ වෘත්තීන් සඳහා වේදිකාවක් සැපයීම

## අභිමතාර්ථ

1. තාක්ෂණයෙන් විසඳිය හැකි ගැටලු හඳුනා ගෙන එම ගැටලුවලට සුදුසු විසඳුම් සොයයි.
2. තාක්ෂණික හැකියා වර්ධනය කර ගනිමින් දියුණු වෙමින් පවතින තාක්ෂණික ලෝකයක එදිනෙදා කාර්ය විශ්වාසයෙන් හා සාර්ථක ව ඉටු කරයි.
3. ජීවන තත්ත්වය නංවාලීම සඳහා තාක්ෂණික ප්‍රතිචාර හා ව්‍යවසායකත්ව හැකියා සංවර්ධනය කිරීමත් සමග අවශ්‍යතා, වුවමනා සහ අවස්ථා විශ්ලේෂණය කරයි.
4. ඉහළ ගුණාත්මක බවින් යුත් තාක්ෂණික මූලාකෘති සහ නිෂ්පාදන නිර්මාණය සඳහා දැනුම, අවබෝධය සහ කුසලතා ගොඩනගයි.
5. තාක්ෂණික ක්‍රියාවලි මගින් සිදුවිය හැකි ගැටලු හා ප්‍රතිවිපාක මත පදනම් ව තක්සේරු කිරීමේ හැකියාව සහිත ව විචාරාත්මක ව හා නිර්මාණශීලී ව තාක්ෂණ ගැටලු විසඳීම සඳහා ක්‍රියා කරයි.
6. විවිධ තාක්ෂණික ප්‍රවීණතා සහිත ව ඵලදායී ව සහ සාමූහික ව කණ්ඩායම් සමග කටයුතු කරයි.
7. තාක්ෂණික ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජීවිත කාලය පුරා ඉගෙනීමෙහි සහ ස්වයං අධ්‍යයනයෙහි යෙදීම කෙරෙහි උනන්දුව හා හැකියාව පෙන්නුම් කරයි.
8. විවිධ තාක්ෂණික පරිසර තුළ වාචික ව හා ලිඛිත ව ඵලදායි ලෙස සන්නිවේදනය කරයි.
9. තාක්ෂණය හා සම්බන්ධ සමාජ, සදාචාරාත්මක හා පාරිසරික බලපෑම් තක්සේරු කර හානිකර බලපෑම් අවම කිරීමට ක්‍රියා කරයි.
10. සමාජයේ සාරධර්ම හා සංස්කෘතිය උචිත ලෙස පිළිබිඹු කෙරෙන තාක්ෂණය හඳුනා ගනියි.

## 3. මොඩියුල ක්‍රියාත්මක කිරීම සඳහා පොදු උපදෙස් මාලාව

### 3.1 ගුරු භවතුනි,

| |
|---|
| මොඩියුලය ක්‍රියාත්මක කිරීමට පෙර, 2026 වසරේ සිට ක්‍රියාත්මක වන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සංකල්ප හා මොඩියුලය පිළිබඳ පූර්ව අදහස් ලබා ගන්න. |

මෙම මොඩියුල සාර්ථක ව හැදෑරීම සඳහා සිසුන්ට පහසුකම් සපයන්නෙකු ලෙස ඔබ මෙම මොඩියුලය ක්‍රියාත්මක කරවන්නේ කෙසේ දැයි යන්න පිළිබඳ ව අවබෝධ කර ගැනීමට **"ජීවිතය සඳහා තාක්ෂණවේදය - Technology for Life"** සඳහා වෙන් වූ මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කළ යුතු ය. ඒ අනුව මොඩියුලය සාර්ථක කර ගැනීම සඳහා සිසුන් දිරිමත් කරමින් ඔවුන්ට සහාය වීම ඔබගෙන් අපේක්ෂා කෙරේ. සිසුන්ට ඔවුන්ගේ ස්වයං ඉගෙනුම් ක්‍රියාවලිය මනා ව කළමනාකරණය කර ගැනීමට ඔබගේ මග පෙන්වීම ලබා දෙන අතර ම ඔවුන්ගේ ප්‍රගතිය පිළිබඳ ව ද අවධානයෙන් සිටිය යුතු ය. සෑම ක්‍රියාකාරකමක් ම අවසානයේ ඇති ගුරු තක්සේරු වාර්තා සම්පූර්ණ කර ලකුණු ලබා දීම සිදු කළ යුතු අතර ඒ අනුව සිසුන්ට ප්‍රතිපෝෂණ හෝ ඉදිරි පෝෂණ ලබා දීමත් ඔබෙන් අපේක්ෂා කෙරේ.

*****මෙම මොඩියුලයෙන් සිසුන්ට හමු වන ඉගෙනුම් අවස්ථා;** පහත දැක්වෙන පරිදි කාර්ය වර්ගවලට වෙන් කර ඇත. එම කාර්යන්ට අදාළ ව පහත පෙළගස්වා ඇති පොදු උපදෙස් සිසුන් දැනුවත් කරන්න. එම උපදෙස් අනුගමනය කරමින් මෙම මොඩියුලය සාර්ථක ව හැදෑරීම සඳහා, සිසුන් දිරිමත් කිරීම හා ඔවුන්ට සහාය වීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

**කාර්ය වර්ගය 01 - ගවේෂණය, පර්යේෂණය, නිරීක්ෂණය හා විශ්ලේෂණය**

- ස්වයං අධ්‍යයන අවස්ථා කෙරෙහි යොමු වී තාත්වික ලෝකයේ වස්තූන්, අයිතම, සිදුවීම් හෝ පුද්ගලයින් පිළිබඳ ගවේෂණ කරන්න.
- නිරීක්ෂණ සටහන්/ක්ෂේත්‍ර සටහන් පැවතීමේ වැදගත්කම හඳුනා ගැනීමෙන් ඒවා අගයන්න.
- වැඩි අවබෝධයක් ලැබීම සඳහා පර්යේෂණයේ යෙදෙන්න.
- නිරීක්ෂණය කරන ලද සාධක විශ්ලේෂණය කර ගැටලු/ අවශ්‍යතා හඳුනා ගන්න.





**කාර්ය වර්ගය 02 - ස්වයං නිර්මාණයේ යෙදීම**

- නිෂ්පාදිතය නිර්මාණය කිරීමේ සහ සැකසීමේ ක්‍රියා පටිපාටි තේරුම් ගන්න.
- නිර්මාණ අදහස චිත්‍රයක් මගින් හෝ ආකෘතියක් මගින් ඉදිරිපත් කරන්න. ක්‍රියාවලිය පියවරෙන් පියවර අනුගමනය කර නිෂ්පාදිතය නිමවා අවසන් කරන්න.
- නිෂ්පාදිතයේ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කරන්න.
- නව්‍යකරණයන් සිදුකරන්න.

**කාර්ය වර්ගය 03 - සැබෑ ජීවිතය හා සම්බන්ධ කිරීම**

- නිදර්ශනවල/ තොරතුරු ගොනුවල දැක්වෙන ක්‍රමවේද, ස්ථාන, උපකරණ, සහ අනෙකුත් අයිතමවල ලක්ෂණ හඳුනා ගන්න.
- විස්තර කියවා අර්ථ නිරූපණය කරන්න.
- නිදර්ශන හා බැඳුණු අදහස් සැබෑ ජීවිතයේ අත්දැකීම් සමග සම්බන්ධ කරන්න.
- ගුරු/ දෙමාපිය/ වැඩිහිටි අධීක්ෂණය යටතේ අන්තර්ජාලය/ ග්‍රන්ථ වැනි මාධ්‍යවලින් ලබා ගන්නා අමතර තොරතුරු ඔස්සේ දැනුම ලබාගන්න.





**කාර්ය වර්ගය 04 - නිර්මාණයක් නිෂ්පාදිතයක් දක්වා ගෙනයාම**

- නිර්මාණයට අදාළ සලකා බැලීම් - යම් නිෂ්පාදිතයක්/ සේවාවක් නිෂ්පාදනයට පෙර සැලකිය යුතු කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.
- සැලසුම් අවශ්‍යතා - අපේක්ෂිත පරිශීලක අවශ්‍යතා සපුරාලීම
- ද්‍රව්‍ය/ ආවුද/ උපකරණ - නිෂ්පාදිතය සඳහා අවශ්‍ය අයිතම සැලසුම් කරන්න.
- නිෂ්පාදිතයේ සංරචක - නිෂ්පාදිතය/ සේවාව මූලිකාංගවලට බෙදා වෙන් කරගන්න.
- පිරිවැය විශ්ලේෂණය - අත්‍යවශ්‍ය පිරිවැය සංරචකවලට ප්‍රමුඛතාව දෙන්න.
- නිෂ්පාදිතය නිවැරදි ශිල්ප ක්‍රම භාවිතයෙන් ආරක්ෂිත ව නිම කරන්න.

**කාර්ය වර්ගය 05 - කණ්ඩායම් ක්‍රියා**

- කණ්ඩායම්ගත වීම, සාකච්ඡා කර පොදු එකඟත්වයකට පැමිණීම, සැලසුම් කිරීම හා කාර්ය සම්පූර්ණ කිරීම යන කටයුතුවල නිරත වන්න.
- සාකච්ඡා මාර්ගයෙන් කාර්ය සම්පූර්ණ කර ගැනීම සඳහා පොදු එකඟතාවයකට පැමිණෙන්න.
- කණ්ඩායම් ක්‍රියාවේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වගකීම් බෙදා ගන්න.
- බෙදා ගත් වගකීම් තුළ අන්තර් සහයෝගීතාවයෙන් කාර්ය/ නිෂ්පාදිතය නිමවන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරීත්වය මගින් ස්වයං නිපුණතා වර්ධනය කර ගන්න.



**කාර්ය වර්ගය 06 - ස්වයං සහ සමපදස්ත ඇගයීම**

- ගන්නා ලද තීරණවල ගුණාත්මකභාවය කාර්යයේ/ නිෂ්පාදිතයේ සාර්ථකත්වය මත පදනම් ව ඇගයීම සිදුකරන්න.
- කාර්ය/ නිර්මාණය/ නිෂ්පාදිතය වැඩි දියුණු කළ හැකි ක්‍රම යෝජනා කරන්න.
- සැබෑ ලෝකයේ නිෂ්පාදිත හා සේවා සමග සසඳා වෙනස්කම් හඳුනා ගන්න.

**ඇගයීම, තක්සේරුව සහ ප්‍රතිපෝෂණය**

- සම්පූර්ණ කරන ලද ස්වයං සහ කණ්ඩායම් කාර්ය අවස්ථා ගුරු තක්සේරුව සඳහා යොමු කරන්න.



## 3.2 මව්පියවරුන් හා වැඩිහිටියන් දැනුවත් කිරීමට උපදෙස්

දරුවා වෙත පිරිනැමෙන ස්වයං ඉගෙනුම් මොඩියුල ප්‍රධාන ක්‍රියාකාරකම් පහකින් සමන්විත වන අතර ශිෂ්‍ය පාදක ඉගෙනුම් අවස්ථා රැසක් ඉටු කිරීමට දරුවා යොමු කරවනු ලබයි. එමගින් දරුවාගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය තාක්ෂණික හුරුව හා මෘදු කුසලතා වර්ධනය කිරීමත් විසි එක්වන සියවසේ වැඩ ලෝකයට ගැළපෙන යහපත් සුහුරු පුරවැසියෙකු (Smart citizen) බිහි කිරීමත් ප්‍රධාන අරමුණු වේ. මොඩියුලයේ අන්තර්ගත වන නිවසේ දී සිදු කිරීමට ඇති ක්‍රියාකාරකම්, ගවේෂණ, පර්යේෂණ අවස්ථා, පාසල් ඉගෙනුම් අවස්ථා මෙන් ම පෙර සූදානම් වීම වැනි කටයුතුවල දී මව්පියවරුන් හා වැඩිහිටියන්ගේ සහාය නොමඳ ව ලබා දෙමින් දූ පුතුන්ට මෙම මොඩියුලය සාර්ථක ව ක්‍රියාත්මක කිරීමට සහයෝගය ලබා දෙන ලෙස දෙමාපියන් හා වැඩිහිටියන් දැනුවත් කරන්න.

# 4. මොඩියුලයේ ක්‍රියාකාරකම්වලට අදාළ වන පූර්ව උපදෙස් මාලාව

## 4.1 සිසුන් දැනුවත් කිරීම සඳහා උපදෙස්

අවස්ථාවක් ලබාගෙන සිසුන්ට මොඩියුලය පිළිබඳ පහත දැක්වෙන දැනුවත් කිරීම් සිදුකරන්න.

- 21 වන සියවසේ නිපුණතා අත්පත් කර ගත හැකි පරිදි සුතථ්‍ය ඉගෙනුමට(Authentic learning) අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම ශිල්ප ඇතුළත් කර ක්‍රියාකාරකම් පාදක ව සකස් කරන ලද ස්වයං අධ්‍යයන මොඩියුලයක් හැදෑරීමේ වැදගත්කම හා එය සාර්ථක ව ක්‍රියාත්මක කිරීම පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- ජීවිතය සඳහා තාක්ෂණවේදය විෂය යටතේ 6 ශ්‍රේණිය තුළ සම්පූර්ණ කළ යුතු මොඩියුල මෙසේයි.

1 වන වාරය - මොඩියුලය 1 හා 2 - 1. හරිත කෘෂි හුරුව - 1
2. මූලික තාක්ෂණ හුරුව - 1

2 වන වාරය - මොඩියුලය 1 හා 2 - 1. හරිත කෘෂි හුරුව - 2
2. යහ පුරුදු සමගින් සුවැති ආහාර

3 වන වාරය - මොඩියුලය 1 හා 2 - 1. හරිත කෘෂි හුරුව - 3
2. මූලික තාක්ෂණ හුරුව - 2

**පෙර සූදානම - සිසුන් සඳහා උපදෙස්**



- සෑම කාර්යයකට ම අදාළ ව **පෙර සූදානම** සඳහා මොඩියුලයේ දී ඇති ස්වයං අධ්‍යයන අවස්ථා කෙරෙහි යොමු වී විමර්ශන, ගවේෂණ, නිරීක්ෂණ, සමීක්ෂණ, පර්යේෂණ හා විශ්ලේෂණ ඔස්සේ දැනුම ලබා ගෙන පූර්ව දැනුමක් ඇති ව සිසුන් පන්ති කාමරයට පැමිණීම අත්‍යවශ්‍ය වන අතර, එමගින් **"දන්නා දෙයින් නොදන්නා දේ ඉගෙනුමට"** (Known to unknown) අවතීර්ණ විය හැකි බව සිසුන් දැනුවත් කරන්න.
- කණ්ඩායම් කාර්යට අදාළ ව මොඩියුලයේ පෙර සූදානම සඳහා දී ඇති උපදෙස් හා තොරතුරු ගොනු පරිශීලනයට යොමු වී කණ්ඩායම එක් ව කාර්ය සැලසුම් කළ යුතු බව සිසුන්ට අවධාරණය කරන්න.
- ස්වයං අධ්‍යයන අවස්ථා ඔස්සේ රැස් කර ගන්නා තොරතුරු පන්ති කාමරයේ දී සිසුන් සමග හුවමාරු කර ගැනීමට සූදානම් ව පැමිණීම අනිවාර්ය බව සිසුන් දැනුවත් කරන්න.

**නිවසේ දී**



- ස්වයං අධ්‍යයන අවස්ථා යටතේ සැලසුම් කර ඇති කාර්ය සම්පූර්ණ කිරීමට දෙමාපිය අධීක්ෂණයට යටත් ව පහත දැක්වෙන අයුරින් තොරතුරු රැස් කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
  - වැඩිහිටියන්, අසල්වැසියන්, සමීපතමයින් හා හිත මිතුරන්ගේ සහාය ලබා ගැනීම
  - දැනුවත් පුද්ගලයින්/ සම්පත් පුද්ගලයින්ගෙන් තොරතුරු හා උපදෙස් ලබා ගැනීම
  - අන්තර්ජාල තොරතුරු ගවේෂණය හා මෘදුකාංග භාවිතය
- සිසුන් ප්‍රායෝගික කාර්යන්හි නිරත වීමේ දී, තොරතුරු රැස් කිරීමේ දී සහ ආවුද හා උපකරණ පරිහරණයේ දී දෙමාපිය වැඩිහිටි හෝ ගුරු අධීක්ෂණය යටතේ ආරක්ෂිත ව සිදු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

**පාසලේ දී**



- ස්වයං අධ්‍යයන අවස්ථා ඔස්සේ රැස් කර ගන්නා තොරතුරු පන්ති කාමරයේ දී මිතුරන් සමග හුවමාරු කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් පිළිබඳ නිරන්තර අවධානයෙන් සිටිමින් ඔවුන් වෙතින් හඳුනා ගනු ලබන කුසලතාවලට අදාළ ව අඛණ්ඩ ව තක්සේරු කර ලකුණු ලබා දීමට කටයුතු කරන්න.
- පන්ති කාමරයේ අවසන් කරනු ලබන ක්‍රියාකාරකම් අඛණ්ඩ ව පවත්වා ගත යුතු බවට සිසුන් දැනුවත් කරන්න.
- සිසු කාර්ය ඌන පූරණය කරමින් අපේක්ෂිත ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීම සඳහා මග පෙන්වන්නෙකු වන්න.



පන්ති කාමරය තුළ දී මෙම මොඩියුලය ක්‍රියාත්මක කිරීම සඳහා මිනිත්තු 50 බැගින් වූ කාලච්ඡේද 12 ක් හිමි වේ. එම කාලය මනා ලෙස කළමනාකරණය කිරීමට සිසුන් මෙහෙයවීම ඔබේ වගකීමක් වනු ඇත.

ඔබේ සටහන් ගොනුවට



විමර්ශන, ගවේෂණ, නිරීක්ෂණ, සමීක්ෂණ, පර්යේෂණ හා විශ්ලේෂණ වැනි ඉගෙනුම් අවස්ථා ඔස්සේ රැස් කර ගනු ලබන තොරතුරු හා ක්ෂේත්‍ර සටහන් මෙන් ම මොඩියුලයේ දී ඇති ඉගෙනුම් අවස්ථා විෂයට අදාළ ව සටහන් ගොනු කරන ඔබේ **සටහන් පොතෙහි** සටහන් කර තබා ගැනීම අත්‍යවශ්‍ය වේ. සිසුන්ගේ මතු ඉගෙනුම සඳහා වැදගත් වන මෙය දැනුම ගබඩාවක් බව සිසුන් දැනුවත් කරන්න.

පාඩමෙන් ඔබ්බට



"පාඩමෙන් ඔබ්බට" යනුවෙන් මොඩියුලයේ දී ඇති උපදෙස් අනුව යමින් සමස්ත ක්‍රියාකාරකම තුළ ලබා ගත් සංක්ෂිප්ත දැනුම පිළිබඳ පසු විපරමක යෙදීමෙන් තව දුරටත් සංවර්ධනය විය යුතු අවස්ථා හඳුනා ගෙන ප්‍රතිපෝෂණය වීමේ හැකියාව ඇති බව සිසුන්ට පැහැදිලි කරන්න.

## 4.2 ගුරු භවතුන් වන ඔබේ පූර්ව දැනුවත් වීමට

- සිසුන් 08කට නොවැඩි වන සේ කාණ්ඩ ගත කළ යුතු වන අතර මොඩියුලය අවසන් වන තෙක් කණ්ඩායම් එලෙස ම පවත්වා ගැනීමට කටයුතු කරන්න. කණ්ඩායමට සුදුසු නායකයෙක් පත්කර ගන්න. (ක්‍රියාකාරකම් සඳහා කණ්ඩායමේ නායකත්වය වෙනස් කරමින් සිසුන් වැඩි පිරිසකට නායකත්ව අවස්ථාව ලබා දෙන්න.)
- දෙමාපියන්/ වැඩිහිටියන්ගේ අධීක්ෂණයට යටත් ව සිසුන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් ස්වයං අධ්‍යයන අවස්ථා යටතේ සැලසුම් කර ඇති කාර්ය සම්පූර්ණ කිරීම සඳහා සිසුන්ට ක්‍රියාත්මක වීමට අවශ්‍ය පසුබිම සැකසීමට දෙමාපියන් දැනුවත් කිරීම ඔබේ වගකීම වේ.
- එමෙන් ම ඔබට සපයා ගත හැකි සම්පත්වලට අනුව යෝජිත කාර්ය, වෙනස්කම් සහිත ව වුව ද අදාළ ඉගෙනුම් පල ළඟා වන පරිදි සැලසුම් කර ගෙන සාර්ථක ව සිදු කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.
- පාසලේ දී කරනු ලබන ශිෂ්‍ය ක්‍රියාකාරකම් ගුරු අධීක්ෂණයට යටත් ව ක්‍රියාත්මක කළ යුතු වේ.
- පාසල තුළ සිදු කරනු ලබන සියලු ම කාර්ය සාර්ථක ව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය සම්පත් සපයා ගැනීම ඇතුළු සියලු අවශ්‍යතා සඳහා ඔබගේ පෙර සූදානම අත්‍යවශ්‍ය වේ.

**පෙර සූදානම - ගුරුභවතුන් සඳහා උපදෙස්**



- එළඹෙන දිනයේ කාර්යයට අදාළ ව පෙර සූදානම සඳහා සැලසුම් සකස් කිරීමට කාලය වෙන් කර සිසුන්ට දන්වන්න.
- සිසුන් සැලසුම් කළ කාර්ය ඔබේ අධීක්ෂණයට ලක් කරන්න.
- එළඹෙන දිනයේ ක්‍රියාවට නැංවීමට සැලසුම් කළ සිසු කාර්ය පිළිබඳ ඔබ දැනුවත් වී ගුරුභවතා ලෙස ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට සූදානම් වන්න.

- මොඩියුලයේ දී ඇති ක්‍රියාකාරකම් සඳහා සිසු ස්වයං අධ්‍යයන ඔස්සේ රැස් කර ගන්නා තොරතුරු ඌන පූර්ණය කිරීමට නිදර්ශක, සමර්පණ (PPT), වීඩියෝ දර්ශන, වෙබ් පිටු පිළිබඳ තොරතුරු පුවත්පත් ලිපි, අත්පත්‍රිකා, සඟරා, අත්පොත් යනාදිය දැනුම සම්ප්‍රේෂණය කළ හැකි මූලාශ්‍ර ලෙස හැකි තාක් රැස් කර තබා ගන්න.
- ස්වයං ඉගෙනුමේ යෙදෙමින් සිසුන් රැස් කර ගන්නා දැනුම ඌන පූර්ණය කරමින්, සිසුන් සමග සංවාද/ සාකච්ඡා සිදු කරන්න.
- මොඩියුලයේ දී ඇති තාක්ෂණික වදන් (Technical terms ) හා ඒවායේ ඉංග්‍රීසි අර්ථය පිළිබඳ ව සැම විට ම සිසුන්ගේ අවධානය යොමු කරන්න. එම තාක්ෂණික වදනේ ඉංග්‍රීසි නාමය සමග ම සිසුන්ට පැහැදිලි කිරීම ඔබ වෙත පැවරෙන වැදගත් කාර්ය භාරයකි.

- ලකුණු ලබා දීම සඳහා සිසු මොඩියුලයේ දී ඇති ගුරු තක්සේරු වගුවල ආකෘති සකස් කරගන්න.
- සෑම ක්‍රියාකාරකමක් අවසානයේ ම සිසුන් වෙතින් හඳුනා ගනු ලබන තාක්ෂණික කුසලතා සහ මෘදු කුසලතාවලට අදාළ ව තක්සේරු කර ලකුණු ලබා දෙන්න. ගුරු තක්සේරුවේ දී කේවල හා කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා ලබා දෙන ලකුණු වාරය අවසානයේ ගණනය කර මුළු ලකුණු සංඛ්‍යාවෙන් සිසුවා ලබා ගත් මුළු ලකුණු ගණන ප්‍රතිශතයක් ලෙසින් ශිෂ්‍ය සාධන මට්ටම වාර්තා කර තබාගන්න.
- ස්වයං තක්සේරුව (Self assessment ) සහ කණ්ඩායම් අනුව සිසුන් කරන ලද කාර්ය ඔවුන් විසින් ම තක්සේරු කිරීම සඳහා සමපදස්ත තක්සේරුව (Peer assessment ) මගින් සිසු මොඩියුලයේ අවස්ථාව ලබා දී ඇත. ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම සිදු කරමින් ඊට අවස්ථාව ලබා දෙන්න.

## 5. පන්ති කාමරය තුළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීමක්

- සිසුන් ලැබූ සුන්දර අත්දැකීම් හා ඔවුන් මුහුණ දුන් ගැටලු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඒ ඔස්සේ ක්‍රියාකාරකමට අදාළ ව 21 වන සියවසට අවශ්‍ය සිසු කුසලතා සංවර්ධනයට මං පාදන නිර්මාණශීලී පිවිසීමක් ලබා ගන්න.
- මොඩියුලය පිළිබඳ මූලික දැනුවත් කිරීමට අනුව සිසුන් රැස් කළ ස්වයං අධ්‍යයන තොරතුරු පිළිබඳ කාර්යයන්ට අදාළ ව කරුණු මතු කරමින් සිසුන් සමග සමාලෝචනයක යෙදෙන්න.
- ස්වයං අධ්‍යයන අවස්ථා යටතේ සිසුන් කරන ලද කාර්ය සාකච්ඡා කරමින් අගයන්න.
- ස්වයං අධ්‍යයන තොරතුරු කුඩා කණ්ඩායම් අතර බෙදා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- දිනක දී අවසන් කළ යුතු කාර්යයන් හා එළඹෙන දිනයේ පෙර සූදානම සඳහා කාලය වෙන් කර සිසුන් දැනුවත් කරන්න.
- කාර්යයන්ට අදාළ ව නිරීක්ෂණ ලබා ගැනීම, ක්‍රියාවට නැංවිය යුතු අවස්ථා ගවේෂණය කිරීම, පරිගණක පහසුකම් ලබා දීම හා වෙනත් අවශ්‍යතා ඇත්නම් ගුරු අධීක්ෂණය යටතේ සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- කාර්ය සඳහා සිසුන් විසින් රැගෙන එන ලද සියල්ල සහ පාසලෙන් ලබා දෙන අවශ්‍යතා සියල්ල ගොනු කර ගැනීමට ඔබේ සහාය ලබා දෙමින් සිසුන් මෙහෙයවන්න.
- සැලසුම් අනුව අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබා ගත් පසු කාර්ය සඳහා සිසුන් යොමු කරන්න.
- සිසු කාර්ය අධීක්ෂණයට ලක් කරමින් ගුරු තක්සේරුව සිදු කරන්න.
- සිසුන් විසින් අවසන් කරනු ලබන කාර්ය අඛණ්ඩ ව පවත්වා ගැනීමට අවශ්‍ය අවස්ථාවන්හි දී ඒ සඳහා සැලසුම් කළ ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කළ යුතු බව සිසුන්ට දන්වන්න.
- ක්‍රියාකාරකම අවසානයේ කුඩා කණ්ඩායම් අතර අත්දැකීම් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න. ඒ සඳහා කාලය වෙන් කර ගෙන සිසුන් දැනුවත් කරන්න.
- ගුරු තක්සේරුව අවසානයේ ප්‍රතිපෝෂණය ලබා දී සංවර්ධනාත්මක පියවරකට සිසුන් යොමු කරන්න.
- එළඹෙන දිනයේ දී නියැළීමට අපේක්ෂිත කාර්ය සැලසුම් කිරීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- කාර්ය සැලසුම් කිරීමේ දී ප්‍රාදේශීය ව වැදගත්කමක් උසුලන දේ ක්‍රියාවට නැංවීම මෙන් ම පරිසර හිතකාමී තාක්ෂණය මුසු වූ නව්‍ය අදහස් එක් කිරීමට අවශ්‍ය මග පෙන්වීම් සිදු කරන්න.
- ගුරු සහාය අවශ්‍ය වුව හොත් ඊට දායකත්වය ලබා දෙන්න.
- සිසුන්ගේ කාර්ය සැලසුම් ගුරු අධීක්ෂණයට ලක් කරන්න. අවශ්‍ය උපදෙස් ඇතොත් ලබා දෙන්න.
- කාර්ය සඳහා පාසලෙන් සැපයිය හැකි දේ සහ සිසුන් විසින් රැගෙන ආ යුතු දේ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කර අවශ්‍යතා ලැයිස්තුව පිළියෙළ කිරීමේ දී එය ඔබේ අධීක්ෂණයට ලක් කරන්න.
- අවශ්‍ය සම්පත් සපයා ගැනීම ඇතුළු සියලු අවශ්‍යතා පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කර දැනුවත් වී එළඹෙන දිනයේ අපේක්ෂිත කාර්ය සඳහා ඔබේ සහාය සිසුන්ට ලබා දෙන්න.

# 6. තක්සේරුව සඳහා පොදු උපදෙස්

## ස්වයං තක්සේරුව හා සමපදස්ත තක්සේරුව

මොඩියුලයේ ක්‍රියාකාරකම්වලට අදාළ ව කාර්යන්හි නිරත වන අතරතුර දී සිසුන් ලබා ගත් දැනුම හා කුසලතා, ඔවුන් විසින් ම තක්සේරු කිරීම හා සම කණ්ඩායම් අතර තක්සේරු අවස්ථා ලබා දීම සඳහා, තක්සේරු පත්‍රිකා මොඩියුලයට ඇතුළත් කර ඇත. එවිට ඔවුන්ට තමන්ගේ හැකියා පිළිබඳ ස්වයං විවරණයක යෙදීමට අවස්ථාව ලැබේ. මෙය සිසුන් පෙලඹවීම සඳහා අත්වැලක් වනු ඇත.

තක්සේරුවෙන් පසු ව ඔවුන්ගේ දැනුම හා හැකියාව අඩු බව හැඟී යාමෙන් මන්දෝත්සාහී වීමට නො දී සිසුන් දිරිමත් කරන්න. සිසුන් තක්සේරුවේ නිරත වීමේ දී, අවශ්‍ය අවස්ථාවල තීරණ ගැනීම සඳහා ඔවුන්ට සහාය වන්න.

## ගුරු තක්සේරුව

**සිසුන්ට හා දෙමාපියන්ට ගුරු තක්සේරුවට අදාළ ව පහත දී ඇති මග පෙන්වීම් සිදු කරන්න.**

- මෙම මොඩියුලය තුළ සිසුන් ක්‍රියාත්මක වන සැම කාර්යයක් ම ගුරුවරයා විසින් අධීක්ෂණය කළ යුතු අතර බොහෝ කාර්යයන් සඳහා ලකුණු ලබා දීම සිදු කෙරේ.
- මෙහි දී සිසුන්ට ලකුණු පිරිනැමෙන නිර්ණායක පිළිබඳ ව සිසුන් හා දෙමාපියන් දැනුවත් වීම වැදගත් වන අතර, එම අවබෝධය ලබා ගැනීමට සැම ක්‍රියාකාරකමක් අවසානයේ ම මොඩියුලයේ දක්වා ඇති ගුරු තක්සේරුව මග පෙන්වීමක් සිදු කරයි.
- මේ පිළිබඳ දෙමාපියන්ට හා සිසුන්ට පූර්ව අවබෝධයක් ලබා දෙන්න.
- සැම කාර්යයකට ම පෙර තමාට ලකුණු ලැබෙන්නේ කවර නිර්ණායකවලටදැයි නැවත නැවත පරිශීලනය කිරීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- ඇගයීම් නිර්ණායක සැම කාර්යයකට ම පෙර දැනුවත් කරන්න.
- ක්‍රියාකාරකම අවසන් වන තෙක් නොසිට එක් එක් කාර්ය සිදු කරන අවස්ථාවේ දී එම කාර්යයට අදාළ ව සියළුම කාර්ය පියවර අඛණ්ඩ ව තක්සේරු කිරීමට වග බලා ගන්න.

**ලකුණු ලබා දීමේ දී පහත දී ඇති උපදෙස් අනුව කටයුතු කරන්න.**

- බහුවිධ කුසලතා සංවර්ධනය කර ගැනීමට සිසුන්ට ඉඩ ප්‍රස්තා ලබා දීම ජීවිතය සඳහා තාක්ෂණවේදය විෂයේ සුවිශේෂ අරමුණක් වන අතර, එහි දී **සම්භවන තක්සේරුව (Formative assessment)** මගින් මෙම විෂයට 70%ක් ලකුණු පිරිනැමෙන අතර 30%ක් ලකුණු වෙන් වන්නේ **සම්පිණ්ඩිත තක්සේරුවටයි (Summative assessment).**
- එහි දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිදු කරන සම්භවන තක්සේරුව මගින් සිසුන්ට ප්‍රතිපෝෂණ ලබා දෙමින් අපේක්ෂිත ඉගෙනුම් පල වෙත සිසුන් ළඟා කරවීමට අපේක්ෂා කෙරේ.
- මෙම සම්භවන තක්සේරුව මගින් මොඩියුලයේ සැම ක්‍රියාකාරකමක් සඳහා ම සකස් කර ඇති ගුරු තක්සේරුව සාර්ථක ව සිදු කළ හැකි අතර, එම තක්සේරු වගුවල ඇති තක්සේරු නිර්ණායක හා කාර්ය සාධන මට්ටම් පිළිබඳ ව මනා අවබෝධයකින් යුතු ව එම කාර්යයේ නිරත වීම වැදගත් වේ.

- මෙහි දී එක් එක් තක්සේරු නිර්ණායක යටතේ සිසුවා ළඟා කර ගත් සාධන මට්ටම අනුව ලකුණු ලබා දීමට කටයුතු කරන්න.

| | |
|---|---|
| සාධන මට්ටම 1 නම් ලකුණු 1 | සාධන මට්ටම 3 නම් ලකුණු 3 |
| සාධන මට්ටම 2 නම් ලකුණු 2 | සාධන මට්ටම 4 නම් ලකුණු 4 |

- ඉහත සාධන මට්ටම 1 ලබා දීමේ දී සිසුවා අදාළ නිර්ණායකය සම්පූර්ණ කිරීමට උත්සාහයක් දරා ඇති විටෙක වුව ද එක් ලකුණක් ලබා දී සිසුවා දිරි ගැන්වීමට කටයුතු කරන්න.
- මොඩියුලය පුරා ම සිසුන් විසින් සංවර්ධනය කර ගනිමින් ප්‍රදර්ශනය කරනු ලබන කුසලතා නිරීක්ෂණය කරමින් තක්සේරුව සිදු කරන්න.
- පාසල තුළ දී සිසුන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරතුර දී සිදු කරන කාර්ය තක්සේරු කර ලකුණු ලබා දෙන්න.
- විෂයයට අදාළ ව, සම්භවන තක්සේරුව මගින් මොඩියුලය සඳහා මුළු ලකුණු සහතිකයට ලබා ගත් ලකුණු ප්‍රමාණය 70% ට ගණනය කරන්න.
- මොඩියුල අවසානයේ නිර්මාණ ප්‍රදර්ශනයක් මගින් සිසු හැකියා පරීක්ෂා කර, සම්පිණ්ඩිත තක්සේරුව සිදු කර ඉතිරි ලකුණු 30% ලබා දීමට කටයුතු කරන්න.
- සම්භවන තක්සේරුව (70%) ක් හා සම්පිණ්ඩිත තක්සේරුව (30%) මගින් සිසුන් ලබාගත් ලකුණු ප්‍රමාණය අවසාන ලකුණු ගණනය කිරීමට යොදා ගන්න.
- තක්සේරුව තුළින් සිසුන්ට ප්‍රතිපෝෂණ ලබා දීම හා අපේක්ෂිත ඉගෙනුම් පල වෙත සිසුන් ළඟා කරවීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.
- මොඩියුලයේ ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීමේ දී, සෑම මොඩියුලයක් අවසානයේ ම දී ඇති මොඩියුලය සඳහා මුළු ලකුණු සහතිකයෙහි ඡායා පිටපතක් බැගින් සිසුන් වෙතින් ලබාගෙන ගොනුවක් පවත්වාගෙන යාමට කටයුතු කරන්න. වාර අවසානයේ එම සහතිකය සිසුන්ට ප්‍රදානය කරන්න.
- සෑම වාරයක් අවසානයේ ම එම වාරයට අදාළ තාක්ෂණික ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නිර්මාණාත්මක සිසු ඉදිරිපත් කිරීම්වලට (ප්‍රදර්ශනයකට) අවස්ථාව ලබා දෙන්න.
- මෙහි දී එක් සිසුවෙක් මොඩියුල දෙක සඳහා ම නිර්මාණ එක බැගින් සෑදිය යුතු වේ. නිර්මාණ සකස් කිරීමේ දී මොඩියුල තුළින් ලබා ගත් කුසලතා සමෝධානය කිරීම ද වැදගත් වේ.
- මොඩියුලය සඳහා හිමිවන අවසාන කාලච්ඡේද එක/දෙක (කාලච්ඡේද 11/12) සිසු නිර්මාණ ප්‍රදර්ශනයේ කටයුතු සඳහා යොදා ගන්න.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඔස්සේ ලත් අත්දැකීම් හා ප්‍රතිපෝෂණ මගින් වැඩි දියුණු කරගත් සිසු හැකියා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම හා ඒවා තක්සේරු කිරීම සිදු කරන්න.

### තක්සේරුව - ප්‍රදර්ශනය සඳහා

- ප්‍රදර්ශනය සඳහා සූදානම් වන සිසුන්ට තක්සේරු නිර්ණායක දැනුවත් කරමින් ලකුණු ලබා ගැනීම සඳහා මග පෙන්වන්න. පහත නිර්ණායක මත පදනම් ව ලකුණු ලබා දීම සිදු කරන්න.
- එක් නිර්ණායකයක් සම්පූර්ණ කර ඇත්නම් උපරිම ලකුණු 2ක් ලබා දෙන්න.

| | තක්සේරු නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 1. | එදිනෙදා ජීවිතයේ හමුවන, තාක්ෂණික විසඳුම්වල අවශ්‍යතාවන් පවතින, ගැටලු හඳුනා ගැනීම | |
| 2. | ගැටලු හඳුනා ගැනීමේ දී අන් අය පිළිබඳ ව සංවේදී චින්තනයක් දැක්වීම | |
| 3. | හඳුනා ගත් ගැටලුව/ ගැටලු සඳහා විවිධ තාක්ෂණික විසඳුම් යෝජනා කිරීම | |
| 4. | විවිධ විසඳුම් අතරින් මොඩියුලයට අදාළ වන, ප්‍රායෝගික ව ක්‍රියාත්මක කළ හැකි/ ඉදිරිපත් කළ හැකි තාක්ෂණික විසඳුමක් තෝරා ගැනීම | |
| 5. | නව්‍යකරණ අදහස් සහිත විසඳුමකට යොමු වී තිබීම | |
| 6. | නිර්මාණාත්මක චින්තනයකින් කටයුතු කිරීම | |
| 7. | මනා සැලසුම් කිරීමක් අනුගමනය කිරීම | |
| 8. | නිෂ්පාදනයට අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීම/ යෝජනා කිරීම | |
| 9. | ද්‍රව්‍ය තේරීමේ දී ද්‍රව්‍ය වියදම අවම වන පහසුවෙන් සපයා ගත හැකි ප්‍රදේශයේ පවතින සම්පත් පිළිබඳ ව සැලකිලිමත් වීම | |
| 10. | නිෂ්පාදන ක්‍රියාවලිය පැහැදිලි ව ඉදිරිපත් කිරීම/ අනුගමනය කිරීම | |
| 11. | නිෂ්පාදන ක්‍රියාවලියේ දී පරිසර හිතකාමී ක්‍රම අනුගමනය කිරීම/ නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ පරිසර හිතකාමී පිළිවෙත් පිළිබඳ ව අදහස් දැක්වීම | |
| 12. | නිෂ්පාදිතය මනා නිමාවකින් යුතු ව සකස් කර ඉදිරිපත් කිරීම | |
| 13. | නිෂ්පාදන ක්‍රියාවලියේ දී යහපත් වැඩ පුරුදු අනුගමනය කිරීම/ අනුගමනය කළ හැකි යහපත් වැඩ පුරුදු පිළිබඳ ව අදහස් දැක්වීම | |
| 14. | ප්‍රදර්ශනය සූදානම් කිරීමේ දී සිසුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම | |
| 15 | නිර්මාණ ඉදිරිපත් කිරීමේ අවස්ථාවට මනා සූදානමකින් හා විශ්වාසයකින් ඉදිරිපත් වීම | |
| | මුළු ලකුණු | |

## 7. මොඩියුලය අවසානයේ මුළු ලකුණු ගණනය කිරීම :

මොඩියුලය සඳහා මුළු ලකුණු සහතිකය ඔස්සේ සිසුවා සම්භවන තක්සේරුවට අදාළ ව ලබා ගත් ලකුණු ප්‍රමාණ ලැබෙන අතර එය ලකුණු හැත්තෑවකට කවර ප්‍රමාණයක් දැයි පහත පරිදි ගණනය කරන්න.

6 ශ්‍රේණියේ පළමු වන වාර මොඩියුලය සඳහා නිසල් ලබා ගත් මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 120න් 108ක් යැයි සලකමු.

- නිසල්ගේ සම්භවන ලකුණු (ලකුණු 70 කට) $= \frac{108}{120} \times 70 \quad = \mathbf{63}$

- නිසල් වාර අවසාන ප්‍රදර්ශනයේ දී සම්පිණ්ඩිත තක්සේරුවෙන් ලබා ගත් ලකුණු ප්‍රමාණය ලකුණු 30න්, 24ක් යයි සලකමු.

ඒ අනුව නිසල්ගේ "ජීවිතය සඳහා තාක්ෂණවේදය" විෂයට අදාළ ව වාර අවසාන/ මොඩියුලය අවසාන මුළු ලකුණු ප්‍රමාණය (නියමිත මුළු ලකුණු ප්‍රමාණය = 70 + 30 = 100)

= 63 + 24 = 87%

මෙම උදාහරණය අනුගමනය කිරීමෙන් ඔබට සිසුන්ගේ වාර අවසාන ලකුණු පහසුවෙන් ගණනය කර ගත හැකි යි.

# මොඩියුලය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ උපදෙස්මාලාව සහ තක්සේරුව

පළමු වාරය - මොඩියුලය 1

## හරිත කෘෂි හුරුව - 1

## හරිත කෘෂි හුරුව - 1 -මොඩියුලයට අදාළ විෂය නිර්දේශය

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | කාල--ච්ඡේද |
|---|---|---|---|---|
| පළමු වාරය | | | | |
| 1.0 හරිත දිවි පැවැත්ම හා සබැඳි පාරිසරික ක්‍රියා අගයමින් පරිසරයේ යහපැවැත්ම සුරැකීමට දායක වෙයි. | ■ පරිසර පද්ධති නිරීක්ෂණය<br>■ විවිධ පරිසර පද්ධති හඳුනා ගැනීම<br>■ සත්ත්ව චර්යා නිරීක්ෂණ<br>■ ජීවීන්ගේ අනුවර්තන නිරීක්ෂණ<br>■ ජීවීන් අතර අන්තර් ක්‍රියා නිරීක්ෂණ<br>■ ශාක චර්යා නිරීක්ෂණ<br>■ පරිසර පද්ධති අන්තර් ක්‍රියා ආශ්‍රිත ප්‍රතිලාභ<br>■ සමතුලිත පරිසරයකින් ලැබෙන ප්‍රතිලාභ<br>■ ආහාරමය<br>■ සෞඛ්‍යමය<br>■ සෞන්දර්යාත්මක<br>■ ආර්ථිකමය<br>■ පාරිසරික යහපැවැත්ම සුරැකීමේ පිළිවෙත් | 1.1 පරිසරයේ යහ පැවැත්මට විවිධ පරිසර පද්ධති අතර පවතින සබැඳියාව අගයයි.<br>1.2 ශාක හා සත්ත්ව චර්යා ජීවීන්ගේ යහ පැවැත්මට දක්වන දායකත්වය නිරීක්ෂණය කර එම තත්ත්ව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව ඉස්මතු කර දක්වයි.<br>1.3 පරිසර පද්ධති අන්තර් ක්‍රියා ආශ්‍රිත ප්‍රතිලාභ ගවේෂණය කර පාරිසරික යහ පැවැතුම්වල අඛණ්ඩ පැවැත්මට දායක වෙයි.<br>1.4 පාරිසරික යහපැවැත්ම සුරැකීමෙන් සමතුලිත පරිසර පද්ධතියක් නිර්මාණය කිරීමේ වැදගත්කම පිළිබඳ ව ඇති අවබෝධය ප්‍රදර්ශනය කරයි. | ■ විවිධ පරිසර පද්ධති පරිසරයේ යහපැවැත්මට දායක වන අයුරු නිරීක්ෂණය කර තොරතුරු වාර්තා කිරීම<br>■ ජීවීන්ගේ යහපැවැත්මට පරිසර පද්ධති අන්තර් ක්‍රියා දායක වන අයුරු ගවේෂණය කර එම තත්ත්ව පවත්වාගෙන යාමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම<br>■ පාරිසරික යහ පැවැත්ම සඳහා පරිසර පද්ධති අන්තර් ක්‍රියා ආශ්‍රිත ප්‍රතිලාභ දක්වන දායකත්වය අඛණ්ඩ ව පවත්වා ගෙන යාමට යෝජනා ගෙන හැර දැක්වීම<br>■ හිතකර පාරිසරික තත්ත්ව මත පදනම් ව පරිසරයේ යහ පැවැත්ම තහවුරු කිරීමට අනුගමනය කළ යුතු පරිසර හිතකාමී .පිළිවෙත් පිළිබඳ තොරතුරු රැස් කිරීම<br>■ සමතුලිත පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා සරල ක්‍රමවේද අනුගමනය කිරීම | 06 |

## හරිත කෘෂි හුරුව - 1 මොඩියුලයට අදාළ විෂය නිර්දේශය

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | කාල-ච්ඡේද |
|---|---|---|---|---|
| පළමු වාරය | | | | |
| 2.0 හරිත පිළිවෙත් ක්‍රියාවට නංවමින් සමතුලිත ගෙවතු පරිසරයක් ගොඩනගයි. | ■ දෛනික අවශ්‍යතා හා ගෙවත්ත<br>■ ආහාර පිඟාන හා බෝග වර්ග<br>■ ඌන භාවිත ආහාර බෝග<br>■ භාවිතය අනුව බෝග කාණ්ඩ<br>■ ගෙවතු වගාවේ ප්‍රතිලාභ<br>■ ගෙවත්තට සුදුසු විවිධත්වයකින් යුත් බෝග තේරීම<br>■ ආහාරබෝග<br>■ ඖෂධ බෝග<br>■ විසිතුරු ශාක<br>■ සමතුලිත ගෙවතු පරිසරයකට සුදුසු පරිදි වටපිටාව සැකසීම<br>■ පස, ජලය, හිරු එළිය සහ ඉඩකඩ යන සම්පත් කළමනාකරණය සඳහා අනුගමනය කළ යුතු හරිත වගා පිළිවෙත්<br>■ ගෙවතු පරිසරය ආශ්‍රිත හිතකර සතුන් සඳහා ගෝචර වූ පරිසරයක් නිර්මාණය කිරීමේ හරිත පිළිවෙත් | 2.1 දෛනික අවශ්‍යතා සහ ගෙවත්තක පවතින සබැඳියාව විමර්ශනය කර ඒ පිළිබඳ ධනාත්මක ආකල්ප ගොඩ නගා ගනියි.<br>2.2 විවිධත්වයකින් යුත් බෝග තෝරා ගෙවත්තේ සිටුවීමෙන් අත්වන ප්‍රතිලාභ ගවේෂණය කර ඒ සඳහා යොමුවෙයි.<br>2.3 ගෙවත්තේ පස, ජලය, හිරු එළිය සහ ඉඩකඩ යන සම්පත් නිසි කළමනාකරණය සඳහා හරිත වගා පිළිවෙත් ක්‍රියාවට නංවයි.<br>2.4 ගෙවත්තට හිතකර සතුන් ආකර්ෂණය සඳහා තාක්ෂණික නිමැවුම් සකසා ගෙවත්තට එක් කරයි.<br>2.5 පාරිසරික යහපැවැත්ම හා බැඳුණු හරිත පිළිවෙත් ගෙවත්තට එක් කර සමතුලිත ගෙවතු වගා පරිසරයක් ගොඩනගයි. | ■ දෛනික අවශ්‍යතා සහ ගෙවත්තක පවතින සබැඳියාව පිළිබඳ විමර්ශනය කර තොරතුරු රැස් කිරීම<br>■ ගෙවතු වගාව පිළිබඳ ගවේෂණය කර ප්‍රතිලාභ ඉදිරිපත් කිරීම<br>■ දෛනික අවශ්‍යතා පදනම් කර ගනිමින් ගෙවත්තට එක් කළ යුතු අංග සැලසුම් කිරීම<br>■ විවිධත්වයකින් යුක්ත ව බෝග තෝරා ගෙවත්තේ සිටුවීම<br>■ පස, ජලය, හිරු එළිය සහ ඉඩකඩ යන සම්පත් සම්බන්ධයෙන් මතු වන ගැටලු විශ්ලේෂණය කිරීම<br>■ හඳුනා ගත් ගැටලු අවම කිරීමට සුදුසු හරිත වගා පිළිවෙත් ක්‍රියාවට නැංවීම<br>■ ගෙවත්ත ආශ්‍රිත ව හිතකර සතුන්ට ගෝචර වූ පරිසරයක් නිර්මාණය සඳහා සරල තාක්ෂණික නිමැවුම් සැකසීම<br>■ පාරිසරික යහපැවැත්මට දායක වන අයුරින් ගෙවත්තට නිර්මාණ එක් කිරීම<br>■ හරිත පිළිවෙත් ක්‍රියාවට නංවමින් ප්‍රියමනාප වූ සමතුලිත ගෙවතු පරිසරයක් ගොඩනැගීම | 06 |

# මොඩියුලය 1 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ උපදෙස්මාලාව
# මොඩියුලය 1 - පළමු වාරය

## හරිත කෘෂි හුරුව - 1

- ☞ සැම ක්‍රියාකාරකමක් ම ආරම්භයට පෙර ගුරු මාර්ගෝපදේශය හා මොඩියුලය මැනවින් පරිශීලනය කරන්න.
- ☞ එහි දී එක් එක් පාඩමට අදාළ ව හඳුනා ගෙන ඇති ඉගෙනුම් පල; විෂය නිර්දේශයේ අඩංගු විෂය අන්තර්ගතය, කාර්ය සාධන ප්‍රමිති හා තක්සේරු නිර්ණායක තුළින් සිසුන් වෙත ළඟා කරන ආකාරය පිළිබඳ ව මනා අවබෝධයක් ලබා ගන්න.
- ☞ එක් කාලච්ඡේදයක් සඳහා නියමිත මිනිත්තු 50ක කාලය මනා ව සැලසුම් කරගන්න.
- ☞ කණ්ඩායම් කාර්ය සඳහා සිසුන් 6-8ක් වන සේ කණ්ඩායම්ගත කරන්න. මොඩියුලය අවසාන වන තෙක් කණ්ඩායම් එලෙස ම පවත්වා ගන්න.
- ☞ එළඹෙන දිනයේ කාර්ය සඳහා පෙර සූදානම සඳහා සිසුන්ට කාලය ලබා දෙන්න.
- ☞ සිසුන්ගේ පෙර සූදානම් සැලසුම් ඔබේ අධීක්ෂණයට ලක් කරන්න.
- ☞ සිසුන් විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන සියලු ම කාර්ය ඔබේ අධීක්ෂණයට ලක් කිරීම අනිවාර්ය වේ. අවශ්‍ය මග පෙන්වීම් සිදු කරන්න.
- ☞ පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ සිසුන් දැනුවත් කර කාර්ය අතරතුර දී ඔබගේ දැඩි අවධානය ද යොමු කරන්න.
- ☞ සැම ක්‍රියාකාරකමක් සඳහා ම දී ඇති ආදර්ශ ගුරු තක්සේරුව අනුගමනය කරමින් ලකුණු ලබා දීම සිදු කරන්න. සිසු කාර්ය අවසානයේ ඌන පූර්ණය කරමින් ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

ඔබේ දැනුමට

https://www.youtube.com/watch?v=BsgSIVw6WPM
Green garden tips-
ගෙවත්ත හා සබැඳි හරිත ඉඟි

https://youtu.be/d94CuPkrvZE
Environmental benefits of gardening-
පාරිසරික ප්‍රතිලාභ ගෙන දෙන ගෙවතු පරිසරය

## ක්‍රියාකාරකම 01

## පරිසරය අපට දෙන දායාද හරි අගෙයි

### පළමු වන දිනය- කාර්ය 1.1

- "ඇහැළ මලින්" ගීතය සැවොම එක් ව ගායනා කිරීමට/ රස විඳීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ගීතයට අදාළ ව සිසුන් විසින් අඳින ලද චිත්‍ර අගයමින් සුදුසු පිවිසීමක් ලබාගන්න.
- අඳින ලද චිත්‍ර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- ජෛව ලෝකයේ පැවැත්මට පරිසරය හා බැඳුනු අංග හා ඒවා අතර ඇති සබැඳියාව මතු කරමින් සිසුන් සමග සංවාදයක් ගොඩනගන්න.
- මොඩියුලයේ දී ඇති උපදෙස් අනුව යමින් පාසලේ ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාවකට සිසුන් යොමු කරන්න.

- සිසුන් රැස් කළ තොරතුරු හඳුනා ගැනීමේ දී ඔබගේ සහාය අවශ්‍ය නම් ඊට දායකත්වය සපයන්න.
- රැස් කළ තොරතුරු ඇසුරින් වගුව 1.1 සම්පූර්ණ කිරීමේ කාර්යට අදාළ ව තක්සේරුව සිදු කරන්න.
- පරිසරය යනු අප අවට ඇති සියළු ජීවී අජීවී අංග හා ඒවා අතර පවතින අන්තර් සම්බන්ධතා බව සිසුන්ට වටහා දෙන්න.

## කාර්ය 1.2

කාර්ය 1.2 ට අදාළ ස්වයං ගවේෂණ අවස්ථාවට යොමු වී තව දුරටත් තොරතුරු රැස් කිරීමේ අවශ්‍යතාව මතු කරමින් සිසුන් ප්‍රේරණය කරන්න. රැස් කරනු ලබන තොරතුරු සටහන් ගොනුවට එක් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

## පෙර සූදානම - කාර්ය 1.4

කාර්ය 1.4ට පෙර සූදානම ලෙස මොඩියුලයේ සැලසුම් කර ඇති කාර්ය 1.3හි දැක්වෙන ස්වයං ගවේෂණ අවස්ථාව සඳහා යොමු වී, එළඹෙන දිනයේ දී කාර්ය 1.4 සිදුකිරීමට අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. කාර්ය 1.4 සඳහා කණ්ඩායම් නිර්මාණ සැලසුම් කිරීමට සිසුන්ට කෙටි වේලාවක් ලබා දෙන්න.

## 02 වන දිනය- කාර්ය 1.4

- සිසු ස්වයං අධ්‍යයන ඔස්සේ රැස් කර ගන්නා තොරතුරු ඌන පූර්ණය කිරීමට නිදර්ශක, සමර්පණ (PPT), වීඩියෝ දර්ශන, වෙබ් පිටු පිළිබඳ තොරතුරු, පුවත්පත් ලිපි, අත්පත්‍රිකා, සඟරා , අත්පොත් යනාදී දැනුම සම්ප්‍රේෂණය කළ හැකි මූලාශ්‍ර ලෙස හැකිතාක් ඔබ සූදානම් කර ගන්න.
    - සත්ත්ව චර්යා නිරීක්ෂණ
    - සත්ත්ව අනුවර්තන නිරීක්ෂණ
    - පළිබෝධකයින් ආහාරයට ගන්නා සතුන්
    - පරාගණකාරකයින්
    - ශාක චර්යා නිරීක්ෂණ
- විවිධාකාරයෙන් ඉදිරිපත් කරන සිසු නිර්මාණ පිළිබඳ විමසිලිමත් වී එම නිර්මාණ (සමර්පණ - PPT, වීඩියෝ දර්ශන, රැස් කළ නිදර්ශක, වෙබ් පිටු පිළිබඳ තොරතුරු, පුවත්පත් ලිපි, අත්පත්‍රිකා, අත්පොත් යනාදිය) ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- සිසුන් අගයමින් ඌන පූර්ණය සිදු කරමින් පාරිසරික යහ පැවැත්මට ශාක හා සතුන් දක්වන දායකත්වය පිළිබඳ කෙටි ගුරු සිසු සාකච්ඡාවක් මෙහෙයවන්න.

ඔබේ පහසුවට

https://youtu.be/sZo5478RHIw

සත්ත්ව අනුවර්තන නිරීක්ෂණ

https://youtu.be/Qx34mJqSAxk

ශ්‍රී ලංකාවේ සත්ත්ව අනුවර්තන නිරීක්ෂණ

## පෙර සූදානම - කාර්ය 1.5

කාර්ය 1.5 සඳහා වන භූමිකා රංගනය ඉදිරිපත් කිරීම සැලසුම් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. භූමිකා රංගනය ඉදිරිපත් කිරීම හා සම්බන්ධ සිසු අවශ්‍යතා සම්පාදනය කිරීමට සැලසුම් කරන්න.

## 03 වන දිනය - කාර්ය 1.5

- පරිසර පද්ධති හා ඒ තුළ සිදුවන අන්තර් ක්‍රියා පිළිබඳ ඔබ දැනුමෙන් සන්නද්ධ වී කාර්ය 1.5 සඳහා සූදානම් වන්න.

https://youtu.be/Yhi4haTSVM0
ශ්‍රී ලංකාවේ ස්වාභාවික පරිසර පද්ධති

https://youtu.be/zvdFu11Xipk
ශ්‍රී ලංකාවේ ස්වාභාවික පරිසර පද්ධති පිළිබඳ සවිස්තරාත්මක ව

- කාර්ය 1.5 යටතේ දී ඇති A,B,C,D,E,F පින්තූර මගින් පරිසර පද්ධති 6 ක් නිරූපණය කරයි. සිසුන් මේ මට්ටමේ දී ඒවා නාමික ව හඳුනා නොගත්ත ද, එම පරිසර පද්ධතිවල වාසය කරන සතුන්ගේ විවිධත්වය, ශාකවල විවිධත්වය, පාරිසරික තත්ත්ව (උෂ්ණත්වය, වර්ෂාපතනය වැනි) යනා දී අංග හඳුනා ගනිමින් ඒවා භූමිකා රංගනයට යොදා ගැනීමට උපදෙස් දෙන්න.
- භූමිකා රංගනය ඉදිරිපත් කිරීමට සිසුන්ට පහසුකම් ලබා දෙන්න. පහත දැක්වෙන ආවරණය කළ යුතු තේමා සැලකිල්ලට ගනිමින් තක්සේරුව සිදු කරන්න.
  - සමතුලිත පරිසරයකින් ලැබෙන ආහාරමය, සෞඛ්‍යමය හා සෞන්දර්යාත්මක ප්‍රතිලාභ
  - මානවයා ඇතුළු සමස්ත මිහිතලයේ පැවැත්මට සමතුලිත පරිසරයේ දායකත්වය
  - ජීවීන්ගේ යහ පැවැත්ම සුරැකෙන අයුරින් පාරිසරික තත්ත්ව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව
- සිසු ඉදිරිපත් කිරීම් අවසානයේ;
  - සමතුලිත පරිසරයේ ලක්ෂණ, සමතුලිත පරිසරයකින් ලැබෙන ප්‍රතිලාභ, පරිසරයේ සමතුලිතතාව බිඳවැටීමට බලපාන මානව ක්‍රියාකාරකම්, පරිසර සමතුලිතතාව බිඳවැටීමෙන් ඇතිවන අහිතකර බලපෑම් හා ඒවා වළක්වා ගැනීමට මානවයාට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ සිසුන් සමග සරල සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - විද්‍යා විෂය යටතේ අධ්‍යයනය කරන ප්‍රභාසංස්ලේෂණය, උත්ස්වේදනය, අකුණු ගැසීම් වැනි වෙනත් ස්වභාවික සංසිද්ධීන් හා ඒවායේ ප්‍රයෝජන ද මතකයට නංවන්න.
  - පරිසරයේ විවිධ ස්වභාවික සංසිද්ධීන් හා ඒවායේ ප්‍රතිඵල තුළින්, මිනිසා ප්‍රයේජන රැසක් ලබන බව සිසුන් සමග සාකච්ඡා කරන්න.

### කාර්ය 1.6

කාර්ය 1.6 සඳහා වූ ස්වයං විශ්ලේෂණ අවස්ථාවට යොමු වී පිළිතුරු සපයා ගෙන එළඹෙන දිනයේ පන්ති කාමරයට පැමිණෙන ලෙස සිසුන් දැනුවත් කරන්න.

### පෙර සූදානම - කාර්ය 1.8 හා 1.9

- පරිසරයේ යහ පැවැත්ම කියා පාන විවිධ පරිසර පද්ධති අපට දායාද කරන ආහාර බෝග සහ ස්වාභාවික සංසිද්ධීන් අඛණ්ඩ ව පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක කළ හැකි පාරිසරික යහ පිළිවෙත් පිළිබඳ තොරතුරු ගවේෂණයට යොමු වීමේ අවශ්‍යතාව සිසුන්ට අවධාරණය කරන්න.
- කාර්ය 1.7හි ස්වයං ගවේෂණ අවස්ථාව සඳහා දී ඇති ඉඟිවලට අමතර ව, පාරිසරික යහ පිළිවෙත් පිළිබඳ තොරතුරු ගවේෂණයට යොමු වී **කාර්ය 1.8 හා 1.9 සඳහා** පෙර සූදානමක් ඇති ව එළඹෙන දිනයේ පන්තියට පැමිණීමේ අවශ්‍යතාව සිසුන්ට තහවුරු කරන්න.

## 04 හා 05 වන දිනය

### කාර්ය 1.8

- ස්වයං ගවේෂණ අවස්ථාවට අනුව සිසුන් රැස් කළ තොරතුරු සමගි පාරිසරික යහ පැවැත්ම හා පාරිසරික යහ පැවැත්මට හානි වූ අවස්ථා සහ එවැනි තත්ත්ව මගහරවා ගැනීමට අනුගමනය කළ යුතු යහ පිළිවෙත් මතු කරමින් සිසුන් සමග සංවාදයක් ගොඩනගන්න.

- පාසල් වත්තේ ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාවකට සිසුන් යොමු කරමින් පාරිසරික යහ පැවැත්මට හානි වූ ස්ථාන හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- පාරිසරික යහ පැවැත්මට හානි වූ අවස්ථා හඳුනා ගෙන ගැටලුවට අදාළ ව පිළියම් හා පිළිවෙත් ලෙස සිසුන් වගුගත කරනු ලබන ඒවායින්, තෝරාගත් ස්ථාන සඳහා විසඳුම් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන පාරිසරික යහ පිළිවෙත් ඔබේ අධීක්ෂණයට ලක් කරන්න.
- ඔවුන්ගේ කාර්ය සැලසුමට අනුමැතිය ලබා දී අවශ්‍ය කටයුතු සඳහා මග පෙන්වීම් සිදු කරන්න.

<u>කාර්ය 1.9</u>

- කාර්ය 1.8හි දී සිසුන්ගේ කාර්ය සැලසුම් අනුව පාරිසරික යහපැවැත්ම සුරැකීම සඳහා යහ පිළිවෙත් ක්‍රියාවට නැංවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- කාර්ය 1.9 අවසන් වීමෙන් පසු මොඩියුලයේ දී ඇති සමපදස්ත තක්සේරුව(Peer assessment) කණ්ඩායම් වශයෙන් සිදු කිරීමට සිසුන් යොමු කරන්න. ඒ සඳහා අන්තර් ඇගයීම සිදුකරන කණ්ඩායම් යුගල ඔබ විසින් නම් කළ යුතු වේ.

<u>ක්‍රියාකාරකම 1 - ගුරු තක්සේරුව</u>

ක්‍රියාකාරකම 1ට අදාළ ව ගුරු තක්සේරුව සෑම කාර්යයක දී ම කළ යුතු අතර ඌන පූර්ණය හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. ක්‍රියාකාරකම අවසානයේ සමස්ත ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනයක් කර ප්‍රතිපෝෂණ ලබා දීම සිදු කරන්න.

# ක්‍රියාකාරකම 02

## ගෙවත්තට හරිත පිළිවෙත් මුසුවෙලා - සතුට සැනසුම එක්වෙලා

### 06 දිනය - <u>කාර්ය 2.1</u>

දෛනික ආහාර අවශ්‍යතා සපුරාලන ගෙවත්තක සබැඳියාව පිළිබඳ ලියූ නිසඳැස් රස විඳීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. සෞඛ්‍ය සම්පන්න ආහාර රටාවක් සඳහා විධිමත් ව හා සැලසුම් සහගත ව වගා කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ සිසුන් සමග සංවාදයක් ගොඩනගන්න.

- ගෙවත්තක වගා කළ හැකි ඌන භාවිත ආහාර බෝග සහ ගෙවතු වගාවේ ප්‍රතිලාභ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- තම ප්‍රදේශයේ පවතින, ගෙවත්තක වගා කළ හැකි බෝග වර්ග අදාළ කාණ්ඩ යටතේ සටහන් කිරීමට අවස්ථාව ලබා දෙන්න. අවශ්‍ය අවස්ථාවන්හි දී සිසුන්ට සහාය වන්න.
- කාර්ය 2.1ට අදාළ ව තොරතුරු ගොනුව 2.1ට අනුව සජීව නිදර්ශක සපයා ගෙන සිසුන්ට හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න. සජීව නිදර්ශක සපයා ගැනීමට අපහසු අවස්ථාවල දී එම ශාකයන්හි ඡායාරූප/ රූප ඇතුළත් සමර්පණයක් සකස් කරන්න. **(කාර්ය 2.1හි_ශාකවලට අදාළ ව බෝග කාණ්ඩ හඳුනා ගැනීම- උද්භිද විද්‍යාත්මක නාම (Botanical names) ලේඛනය පිටු අංක 19හි දී ඇත.)**

<u>පෙර සූදානම - කාර්ය 2.2</u>

- එළඹෙන දිනයේ දී කාර්ය 2.2 සඳහා කණ්ඩායම් කාර්ය සැලසුම් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පාසල් භූමියේ පවතින ඉඩකඩ සීමා තුළ බෝග සිටුවීම සඳහා සැලසුම් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න. සිටුවීම සඳහා බෝග තේරීමේ දී කෙටිකාලීන බෝග තේරීම වඩාත් යෝග්‍ය වන අතර, විවිධත්වයකින් යුක්ත ව බෝග තේරීමට සිසුන් යොමු කරන්න.
- ඉහත කාර්ය ඔබේ අධීක්ෂණයට ලක්කරන්න.

### 07 වන දිනය - <u>කාර්ය 2.2</u>

- පාසල් ගෙවත්තේ බෝග සිටුවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න.
- සිට වූ පසු බෝග නඩත්තුව අඛණ්ඩ ව සිදු කරන ආකාරය පිළිබඳ සැලසුමක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව සිසුන්ට අවධාරණය කරන්න.

## කාර්ය 2.1- බෝග කාණ්ඩ හඳුනා ගැනීම - උද්භිද විද්‍යාත්මක නාම (Botanical names)

### එළවලු බෝග

ආලංගා - *Ipomoea alba*
අවර - *Canavalia enisiformis (L.)*
නියං වැටකොළු - *Luffa cylindrica (L.)*
හේන් වැටකොළු - *Luffa acutangula*
වඳුරු මෑ - *Mucuna prurien*
බණ්ඩක්කා- *Abelmoschus esculentus*
(ඇත්දළ බණ්ඩක්කා /අලි බණ්ඩක්කා)
තක්කාලි-*Solanum lycopersicum*
(ගොරක තක්කාලි)
පාත්‍ර ලබු - *Lagenaria siceraria*

### පලතුරු බෝග

මාදං - *Syzygium cumini*
බෙලි - *Aegle marmelos*
පැණි දොඩම් - *Citrus sinensis*
අඹරැල්ලා - *Spondias dulcis*
මසං - *Ziziphus mauritiana*
පේර - *Psidium guajava*
මොර - *Dimocarpus longan*
දෙළුම් - *Punica granatum*
උගුරැස්ස - *Flacourtia indica*
වැලි අනෝදා *Annona reticulata*
කටු අනෝදා - *Annona muricata*

### මාශ බෝග

සෝයා බෝංචි - *Glycine max*
උඳු - *Vigna mungo*
කව්පි - *Vigna unguiculata*
කහ මුං-
මුං - *Vigna radiata*
(පින්න මුං)

### ව්‍යංජන ලෙස ආහාරයට ගත හැකි බෝග

#### පළා ලෙස ආහාරයට ගත හැකි ශාක

තෙබු - *Costus speciosus*
කළුකම්බෙරිය- *Solanum nigrum*
කුරිඤ්ඤං - *Gymnema lactiferum*
පෙති තෝර - *Cassia tora*
පිටසුදු සාරණ - *Boerhavia diffusa*
කෝවක්කා - *Coccinia grandis*
ඇඹුල් ඇඹිලිය - *Oxalis corniculata*
කිරි හැන්ද - *Celosia argentea*
නීරමුල්ලිය - *Hygrophila schulli*

#### දළු ආහාරයට ගත හැකි ශාක

වට්ටක්කා - *Cucurbita moschata*
මැල්ල - *Olax zeylanica*
වැල් කොහිල - *Syngonium angustatum*
එරබදු - *Erythrina variegata*
මියන - *Acrostichum Esculentum*
කැබෑල්ල - *Aporosa cardiosperma*
වැල්දොඩම් - *Passiflora edulis*

### අල ආහාරයට ගත හැකි ශාක

නෙළුම් - *Nelumbo nucifera*
හිගුරල - *Dioscorea alata*
කොහිල - *Lasia spinosa*
හුලංකීරිය - *Maranta arundinacea*
බුත්සරණ - *Canna indica*
කිඩාරම් - *Amorphophallus paeoniifoliu*
මඤ්ඤොක්කා - *Manihot esculenta*
කිරි අල *Xanthosoma sagittifolium*
ඉන්නල *Plectranthus rotundifolius*

### ධාන්‍ය බෝග

කුරහන් - *Eleusine coracana*
මෙනේරි - *Panicum miliaceum*
බඩ ඉරිඟු - *Zea mays*
සෝගම් (ඉදල් ඉරිඟු) - *Sorghum bicolor(L)*
තණහාල් - *Setaria italica*

### කොළ කැඳ ලෙස ආහාරයට ගත හැකි ශාක

හාතවාරිය - *Asparagus racemosus*
රණවරා - *Cassia auriculata*
වැල්පෙනෙල - *Cardiosprmum halicacabum*
මොනරකුඩුම්බිය - *Veronia cinerea*
හීන් බෝවිටියා - *Osbeckia octandra*

### රසකාරක බෝග

රම්පෙ- *Pandanus amaryllifolius*
කරපිංචා- *Murraya koenigii*
සේර- *Cymbopogon citratus*
බැසිල්- *Ocimum basilicum*
මිංචි- *Mentha arvensis*

## 08 වන දිනය - කාර්ය 2.3

- කාර්ය 2.3ට අදාළ ව වගුව 2.1හි තොරතුරු ඇතුළත් කරමින් පාසල් පරිසරයේ නිරීක්ෂණ චාරිකාවක යෙදීමට සිසුන් යොමු කරන්න.
- පස, ජලය, හිරු එළිය සහ ඉඩකඩ ආශ්‍රිත ව ගෙවත්තේ පවතින ගැටලු විශ්ලේෂණය කිරීමේ දී සිසුන් සමග ඔවුන් රැස් කළ තොරතුරු ඌන පූර්ණය කරමින් සාකච්ඡා කරන්න.
- මොඩියුලයේ දී ඇති ස්වයං තක්සේරුව සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

### පෙර සූදානම - කාර්ය 2.4

- කාර්ය 2.4 සඳහා කණ්ඩායම් කාර්ය සැලසුම් කිරීමට සිසුන් යොමු කරන්න.
- පිළියම් ලෙස සුදුසු හරිත වගා පිළිවෙත් ක්‍රියාවට නැංවීම සඳහා (කාර්ය 2.4) සිසුන් විසින් පිළියෙළ කරනු ලබන කාර්ය සැලසුම් අධීක්ෂණය කරන්න.
- ක්‍රියාවට නැංවීමට කරන ලද සැලසුම් නිරීක්ෂණය කර ඒවා ක්‍රියාවට නැංවීමට ඔබේ අනුමැතිය ලබා දෙන්න. අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සපයා ගැනීමට සැලසුම් කරන්න.

## 09 වන දිනය- කාර්ය 2.4

ගෙවත්තට සුදුසු හරිත වගා පිළිවෙත් කණ්ඩායම්ගත ව ක්‍රියාවට නැංවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. පාසලේ දී නිරීක්ෂණය කරන ලද ගැටලු කණ්ඩායම් අතර බෙදා දී, එක් එක් කණ්ඩායම් විසින් තෝරා ගත් ගැටලුවක් සඳහා එක් පිළිවෙතක් ක්‍රියාත්මක කර, එම ගැටලුව විසඳීමට යොමු කරන්න.

## 10 වන දිනය - කාර්ය 2.5

- කාර්ය 2.5ට අදාළ තොරතුරු ගොනුව පරිශීලනය කර එළඹෙන දිනයේ දී ගෙවතු පරිසරය ආශ්‍රිත හිතකර සතුන්ට ගෝචර වූ පරිසරයක් නිර්මාණය කිරීමට කණ්ඩායම එක් ව නිර්මාණාත්මක ඇටවුමක් සැලසුම් කිරීමට සිසුන් යොමු කරන්න.
- නිර්මාණාත්මක ඇටවුමක් සඳහා අඳින ලද නිර්මාණ සැලසුම (සංකල්පීය නිර්මාණ සැලසුම - Conceptual design plan) පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සැලසුම් කළ නිර්මාණාත්මක ඇටවුම පාසලේ දී නිර්මාණය කර ගෙවතු පරිසරයට එක් කිරීම සඳහා සූදානම් ව පැමිණිය යුතු බැවින් ඒ සඳහා සිසුන් මෙහෙයවන්න.

## 11 වන දිනය - කාර්ය 2.6

- සැලසුම් කළ නිර්මාණාත්මක ඇටවුම පාසලේ දී නිර්මාණය කර ගෙවතු පරිසරයට එක් කිරීම සඳහා සිසුන් යොමු කරන්න.
- ගෙවතු පරිසරය ආශ්‍රිත හිතකර සතුන්ට ගෝචර වූ පරිසරයක් නිර්මාණය කිරීමට කණ්ඩායම එක් ව පරිසරයට එක් කළ නිර්මාණාත්මක ඇටවුම් හේතුවෙන් පාරිසරික ව අහිතකර තත්ත්ව (ඩෙංගු උවදුර වැනි තත්ත්ව) ඇති වීමේ අවදානම සිසුන්ට පහදා දෙන්න.
- එබැවින් එම නිර්මාණ අඛණ්ඩ ව නඩත්තු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් ඒ සඳහා අඛණ්ඩ සැලසුමක් සකසා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එසේ ම එම සැලසුම අඛණ්ඩ ව ක්‍රියාත්මක වන්නේ දැයි සොයා බැලීමට වැඩ පිළිවෙළක් සකසන්න.

### නිර්මාණ ප්‍රදර්ශනය

⋆ ⋆ ⋆ වාර අවසාන නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සූදානම් වීමට සිසුන්ට මග පෙන්වන්න.

ගුරු මාර්ගෝපදේශයේ පිටුව 10-11 නැවත පරිශීලනය කර වාර අවසාන නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සිසුන් දැනුවත් කර සැලසුම් කරන්න.

### ක්‍රියාකාරකම 2 - ගුරු තක්සේරුව

ක්‍රියාකාරකම 2ට අදාළ ව ගුරු තක්සේරුව සෑම කාර්යයක දී ම කළ යුතු අතර ඌන පූර්ණය හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. ක්‍රියාකාරකම අවසානයේ සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක් කර ප්‍රතිපෝෂණ ලබා දීම සිදු කරන්න.

# ගුරු තක්සේරුව- මොඩියුලය 1 - හරිත කෘෂි හුරුව 1

තක්සේරු වගුවල සඳහන් කර ඇති නිර්ණායක පදනම් කර ගනිමින් සිසුන් විසින් කරනු ලබන කාර්ය පිළිබඳ ඇගයීම් සිදු කරන්න. ශිෂ්‍ය කාර්ය සාධනය විනිවිදභාවයකින් යුතු ව තක්සේරු කළ බව සහතික කරමින් එම ලකුණු සිසුන්ට ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 1 - පරිසරය අපට දෙන දායාද හරි අගෙයි

ලකුණු - 20

| නිර්ණායක \ සාධන මට්ටම | 4 | 3 | 2 | 1 | ලකුණු |
|---|---|---|---|---|---|
| කාර්ය 1.1- පරිසර අංග ගවේෂණය කර නිරීක්ෂණ වගු ගත කිරීම<br>■ ජීවී අංග<br>■ අජීවී අංග<br>■ ජීවී-ජීවී අංග<br>■ ජීවී-අජීවී අංග | නිර්ණායක 4ට ම අදාළ ව ගොනු කළ තොරතුරු නිවැරදියි. | නිර්ණායක 3කට අදාළ ව ගොනු කළ තොරතුරු නිවැරදියි. | නිර්ණායක 2කට අදාළ ව ගොනු කළ තොරතුරු නිවැරදියි. | නිර්ණායක 1කට අදාළ ව ගොනු කළ තොරතුරු නිවැරදියි. | |
| කාර්ය 1.4- සොබා ලොව හැඩ කරන අරුම පුදුම ජීව ලොව පිළිබඳ තොරතුරු ඇතුළත් නිර්මාණාත්මක සැකසීමක් ඉදිරිපත් කිරීම<br>■ තොරතුරුවල ප්‍රමාණවත් බව<br>■ නිරවද්‍යතාව<br>■ නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම<br>■ කණ්ඩායම් ක්‍රියාකාරී සහභාගීත්වය | නිර්ණායක සියල්ල පූර්ණ කර ඇත. | නිර්ණායක 3ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 2ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 1ක් පූර්ණ කර ඇත. | |
| කාර්ය 1.5- පරිසරය සමග ඇති ජීවී අජීවී සබැඳියාවක අපූරුව නිරූපණය කරන භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීම<br>■ අපේක්ෂිත තොරතුරුවල පූර්ණ බව<br>■ තොරතුරුවල නිරවද්‍යතාවය<br>■ නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම<br>■ සන්නිවේදන කුසලතා | නිර්ණායක 4ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 3ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 2ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 1ක් පූර්ණ කර ඇත. | |
| කාර්ය 1.8- පවත්නා පාරිසරික ගැටලුවලට විසඳුම් ලබා දිය හැකි ක්‍රම ශිල්ප පරිසරයට එක් කිරීමට සැලසුම් කිරීම<br>■ පාරිසරික ගැටලු සුවිශේෂ කර හඳුනා ගැනීම<br>■ ගැටලු සඳහා අදාළ විසඳුම් යෝජනා කිරීම<br>■ සාමූහික එකඟත්වය<br>■ සැලසුම් කළ පාරිසරික යහ පිළිවෙත්වල අදාළත්වය<br>■ නිසි කාල කළමනාකරණය | කුසලතා 5ම පූර්ණ කර ඇත. | කුසලතා 3-4ක් පූර්ණ කර ඇත. | කුසලතා 2ක් පූර්ණ කර ඇත. | කුසලතා 1ක් පූර්ණ කර ඇත. | |
| කාර්ය 1.9- පාරිසරික යහ පැවැත්ම සුරැකීම සඳහා යහ පිළිවෙත් ක්‍රියාවට නැංවීම<br>■ ක්‍රියාවට නංවන ලද පිළිවෙත්හි පූර්ණ බව<br>■ ක්‍රියා පිළිවෙත් පරිසර හිතකාමී වීම<br>■ සුදුසු ද්‍රව්‍ය/ ආවුද / උපකරණ භාවිතය<br>■ කාර්ය පරිශ්‍ර යථාවත් කිරීම | නිර්ණායක 4ම පූර්ණ කර ඇත. | නිර්ණායක 3ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 2ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 1ක් පූර්ණ කර ඇත. | |

## ක්‍රියාකාරකම 2-ගෙවත්තට හරිත පිළිවෙත් මුසුවෙලා-සතුට සැනසුම එක්වෙලා

| ලකුණු - 20 | | | | | |
|---|---|---|---|---|---|
| සාධන මට්ටම / නිර්ණායක | 4 | 3 | 2 | 1 | ලකුණු |
| කාර්ය 2.1 - විවිධ බෝග කාණ්ඩවලට අයත් ප්‍රාදේශීය විභව හඳුනා ගෙන සටහන් කිරීම<br>▪ පූර්ව සූදානම<br>▪ ක්‍රියාකාරී සහභාගීත්වය<br>▪ සහයෝගීතාව<br>▪ කාල කළමනාකරණය<br>▪ ආවුද හා උපකරණ භාවිතයෙන් පසු නිසි පරිදි ගබඩා කිරීම | සෑම බෝග කාණ්ඩයකට ම අමතර බෝග දෙක බැගින් හඳුනා ගෙන සටහන් කර ඇත. | බෝග කාණ්ඩ 8කට අමතර බෝග දෙක බැගින් හඳුනා ගෙන සටහන් කර ඇත. | බෝග කාණ්ඩ 4කට අමතර බෝග දෙක බැගින් හඳුනා ගෙන සටහන් කර ඇත. | උත්සාහයක් දරා ඇත. මග පෙන්වීමක් අවශ්‍ය වේ. | |
| කාර්ය 2.2 - විවිධත්වයකින් යුත් බෝග තෝරා ගෙවත්තේ සිටුවීම<br>▪ සිටුවීම සඳහා සුදුසු විවිධ බෝග තේරීම<br>▪ පූර්ව සූදානම<br>▪ ක්‍රියාකාරී සහභාගීත්වය<br>▪ සහයෝගීතාව<br>▪ කාල කළමනාකරණය<br>▪ ආවුද හා උපකරණ භාවිතයෙන් පසු නිසි පරිදි ගබඩා කිරීම | නිර්ණායක සියල්ල පූර්ණ කර ඇත. | නිර්ණායක 4-5ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 2-3ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 1ක් පූර්ණ කර ඇත. | |
| කාර්ය 2.3- ගෙවත්ත ආශ්‍රිත ගැටලු අවම කිරීමට හරිත වගා පිළිවෙත් සැලසුම් කිරීම<br>▪ තොරතුරු රැස් කිරීමේ පූර්ණ බව (වගුව 2.1)<br>▪ ගැටලු හඳුනා ගැනීම<br>▪ සැලසුම සකස් කිරීම<br>▪ නිසි කාල කළමනාකරණය | නිර්ණායක 4ම පූර්ණ කර ඇත. | නිර්ණායක 3ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 2ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 1ක් පූර්ණ කර ඇත. | |
| කාර්ය 2.4 - ගෙවත්ත ආශ්‍රිත ගැටලු අවම කිරීමට හරිත වගා පිළිවෙත් ක්‍රියාවට නැංවීම<br>▪ තෝරාගත් ගැටලුවට විසඳුම අදාළ වීම<br>▪ කාර්ය සාර්ථක ව නිම කිරීම<br>▪ සහයෝගීතාව<br>▪ පරිසර හිතකාමී බව<br>▪ කාර්ය පරිශ්‍ර යථාවත් කිරීම | කුසලතා 4-5 ක් පූර්ණ කර ඇත. | කුසලතා 3 ක් පූර්ණ කර ඇත. | කුසලතා 2 ක් පූර්ණ කර ඇත. | කුසලතා 1ක් පූර්ණ කර ඇත. | |
| කාර්ය 2.6- හිතකර සතුන්ට ගෝචර වූ ගෙවතු පරිසරයක් නිර්මාණය කිරීම<br>▪ සංකල්පීය නිර්මාණ සැලසුම ඉදිරිපත් කිරීම<br>▪ ඇටවුම නිර්මාණශීලී වීම<br>▪ නිර්මාණයේ අදාළත්වය<br>▪ තාක්ෂණික දැනුම උපයෝගීතාව<br>▪ ඇටවුමේ මනා නිමාව | නිර්ණායක 4-5 ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 3 ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 2 ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 1 ක් පූර්ණ කර ඇත. | |

# මොඩියුලය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ උපදෙස්මාලාව සහ තක්සේරුව

## පළමු වාරය - මොඩියුලය 2

# මූලික තාක්ෂණ හුරුව 1

## මූලික තාක්ෂණ හුරුව 1 මොඩියුලයට අදාළ විෂය නිර්දේශය

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | කාල--ච්ඡේද |
|---|---|---|---|---|
| පළමු වාරය | | | | |
| 1.0 වැඩපොළ ද්‍රව්‍ය, අත් ආවුද හා උපකරණ උචිත අන්දමින් තෝරා ගෙන කිසියම් නිෂ්පාදිතයක කාර්මික කාර්යන් ආරක්ෂිත ව ඉටු කරයි. | ■ භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගත හැකි ද්‍රව්‍ය සහ උපාංගවල ගුණාංග<br>■ ගුණාංග පදනම් කර ගනිමින් සුදුසු ද්‍රව්‍ය තේරීම<br>■ තාක්ෂණික කාර්ය සඳහා සුදුසු අත් ආවුද හා උපකරණ නිසි ලෙස පරිහරණය<br>  ■ කාර්ය<br>  ■ අත් ආවුද හා උපකරණ<br>■ වැඩහලෙහි ආරක්ෂාව<br>■ ආරක්ෂාකාරී ලෙස අත් ආවුද හා උපකරණ භාවිතය<br>■ අත් ආවුද හා උපකරණ නඩත්තු කිරීම හා විධිමත් ආකාරයට ගබඩා කිරීම | 1.1 නිෂ්පාදිතයක් සඳහා සුදුසු ද්‍රව්‍ය තෝරා ගනියි.<br>1.2 මූලික වැඩහල් ක්‍රියාවලි සඳහා උචිත සරල අත් ආවුද සහ උපකරණ භාවිත කරයි.<br>1.3 උචිත ක්‍රම භාවිත කර නිෂ්පාදිතයක් එකලස් කරයි.<br>1.4 වැඩහල් සරල අත් ආවුද හා උපකරණ භාවිතයේ දී ආරක්ෂාව තහවුරු කරයි.<br>1.5 නිවැරදි ඇසිරීම සහ නඩත්තුව මගින්සරල අත් ආවුද සහ උපකරණ පරිහරණය කර, භාවිතයෙන් පසු නිවැරදි ව අසුරා ගබඩා කරයි. | ■ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී ඒ සඳහා යෝග්‍ය ද්‍රව්‍ය ඒවායේ ගුණාංගවලට අනුකූල ව සහ නිෂ්පාදන ක්‍රියාවලියට ගැළපෙන ආකාරයට තෝරා ගැනීම<br>■ වැඩපොළ අත් ආවුද සහ උපකරණ, අවශ්‍යතාවට ගැළපෙන ලෙස තෝරා ගෙන එමගින් නිවැරදි ශිල්ප ක්‍රම භාවිත කරමින් ආරක්ෂිත ලෙස භාණ්ඩ නිෂ්පාදනය කිරීම<br>■ වැඩපොළ අත් ආවුද සහ උපකරණ නඩත්තුව සහ නිසි අයුරින් ගබඩා කර තැබීම සඳහා තිබිය යුතු කුසලතා භාවිත කිරීම | 06 |
| 2.0 භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය රූපණ සහ සැකිලි සකසයි. | ■ පරිසර හිතකාමී නිෂ්පාදනවල ලාක්ෂණික ගුණාංග<br>■ සංකල්පනාත්මක නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා ද්විමාන (2D)/ ත්‍රිමාන (3D) රූප සහ ආකෘති යොදා ගැනීම<br>  ■ නිදහස් අතින් දළ රූප සටහන් ඇඳීම<br>  ■ ආකෘති නිර්මාණය<br>■ පරිසර හිතකාමී නිෂ්පාදිත සැකසීම | 2.1 සාම්ප්‍රදායික කලාත්මක නිෂ්පාදිත තක්සේරු කරයි.<br>2.2 අත්කම් නිෂ්පාදිතවල විශේෂාංග නිදහස් අතින් ගොඩනගයි.<br>2.3 ද්විමාන සහ ත්‍රිමාන දළ සටහන් භාවිතයෙන් සරල කලාත්මක නිෂ්පාදිත නිරූපණය කරයි.<br>2.4 පරිගණක තාක්ෂණය භාවිත කර රූපණ ගොඩනගයි.<br>2.5 පරිසර හිතකාමී නිෂ්පාදිත සැකසීම අත්දකියි. | ■ සාම්ප්‍රදායික කලාත්මක නිෂ්පාදිතවල භාවිත කර ඇති ද්‍රව්‍ය, යොදා ගෙන ඇති කලාත්මක ලක්ෂණ සහ නිෂ්පාදන ක්‍රම හඳුනා ගෙන ඒවායේ අදාළත්වය තක්සේරු කිරීම<br>■ අත්කම් භාණ්ඩවලට විශේෂිත අංග නිසි හැඩයෙන්, වර්ණයෙන් සහ ශිල්ප ක්‍රම භාවිතයෙන් නිදහස් අතින් ගොඩනැගීම<br>■ කලාත්මක භාණ්ඩ පිළිබඳ නිර්මාණ සංකල්පවල ද්විමාන සහ ත්‍රිමාන දළසටහන් නිදහස් අතින් ඇඳ දැක්වීම<br>■ කලාත්මක නිෂ්පාදිතයන්ගේ නිර්මාණ සංකල්ප පරිගණක මෘදුකාංග යොදා ගෙන සිදු කිරීම<br>■ පරිසර හිතකාමී සහ නව්‍ය නිෂ්පාදනය සඳහා යොමු වීම | 06 |

## මොඩියුලය 2 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ උපදෙස් මාලාව

## මොඩියුලය 2 - පළමු වාරය

## මූලික තාක්ෂණ හුරුව 1

- ☞ සෑම ක්‍රියාකාරකමක් ම ආරම්භයට පෙර ගුරු මාර්ගෝපදේශය හා මොඩියුලය මැනවින් පරිශීලනය කරන්න.
- ☞ එහි දී එක් එක් පාඩමට අදාළ ව හඳුනා ගෙන ඇති ඉගෙනුම් පල; විෂය නිර්දේශයේ අඩංගු විෂය අන්තර්ගතය, කාර්ය සාධන ප්‍රමිති හා තක්සේරු නිර්ණායක මගින් සිසුන් වෙත ළඟා කරන ආකාරය පිළිබඳ ව මනා අවබෝධයක් ලබා ගන්න.
- ☞ එක් කාලච්ඡේදයක් සඳහා නියමිත මිනිත්තු 50ක කාලය මනා ව සැලසුම් කර ගන්න.
- ☞ කණ්ඩායම් කාර්ය සඳහා සිසුන් 6-8ක් වන සේ කණ්ඩායම්ගත කරන්න. මොඩියුලය අවසාන වන තෙක් කණ්ඩායම් එලෙස ම පවත්වා ගන්න.
- ☞ එළඹෙන දිනයේ කාර්ය සඳහා පෙර සූදානම සඳහා සිසුන්ට කාලය ලබා දෙන්න.
- ☞ සිසුන්ගේ පෙර සූදානම් සැලසුම් ඔබේ අධීක්ෂණයට ලක් කරන්න.
- ☞ සිසුන් විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන සියලු ම කාර්ය ඔබේ අධීක්ෂණයට ලක් කිරීම අනිවාර්ය වේ. අවශ්‍ය මග පෙන්වීම් සිදු කරන්න.
- ☞ පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ සිසුන් දැනුවත් කර කාර්ය අතරතුර දී ඔබගේ දැඩි අවධානය ද යොමු කරන්න.
- ☞ සෑම ක්‍රියාකාරකමක් සඳහා ම දී ඇති ආදර්ශ ගුරු තක්සේරුව අනුගමනය කරමින් ලකුණු ලබා දීම සිදු කරන්න. සිසු කාර්ය අවසානයේ ඌන පූර්ණය කරමින් ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 01

## මූලික වැඩහල් ක්‍රියාවලි ඉටු කරමු

පළමු දිනය

කාර්ය 1.1

සියල්ලට ම පෙර ආරක්ෂාව බව සිසුන්ට අවධාරණය කරන්න.

කාර්ය 1.2

- කාර්ය 1.2හි දී ඇති ඔරිගාමී **(Origami)** ව්‍යුහය පන්ති කාමරයේ දී ම සැකසීම සඳහා ඉඩ සලසන්න.
- ඒ සඳහා $A_4$ කඩදාසි හෝ එවැනි කඩදාසි කිහිපයක් සිසුන්ට බෙදා දීමට කටයුතු කරන්න.
- සරල ආකර්ෂණීය නිමැවුම් තුළ ඇති සංකල්ප, නව තාක්ෂණයේ දී සංකීර්ණ නිෂ්පාදිතයන්ට පදනම් වන බව "අභ්‍යවකාශයට ඔරිගාමී" වීඩියෝව ඇසුරින් සරල ව පහදා දෙන්න. ඒ ඔස්සේ තාක්ෂණය හැදෑරීම පිළිබඳ සිසුන් තුළ කුතුහලය හා ආකර්ෂණය ඇති කරන ලෙස කටයුතු කරන්න.

පෙර සූදානම - කාර්ය 1.3/ කාර්ය 1.4/ කාර්ය 1.5/ කාර්ය 1.6

කාර්ය 1.3

- කාර්ය 1.3හි දී ඇති උපදෙස් පරිශීලනය කරමින් සුදුසු ද්‍රව්‍ය තෝරා ගෙන පින්තූර රාමුවක් සකසා පාසලට එන දිනයේ **(Day 2)** එම නිෂ්පාදිතය රැගෙන එන ලෙස සිසුන් දැනුවත් කරන්න.
- නිෂ්පාදිතය සඳහා තරමක් තද හා සිහින් කාඩ්බෝඩ් ලෙස, ෆයිල් කවර සහ ඇසුරුම් සඳහා භාවිත කරන කාඩ්බෝඩ් භාවිත කළ හැකි බව සිසුන් දැනුවත් කරන්න.

කාර්ය 1.4

- කාර්ය 1.4හි දී ඇති ද්‍රව්‍ය ගුණ පරීක්ෂාවට අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගෙන නිවසේ දී එය අත්හදා බලා **Day2** සඳහා වන 1.4 කාර්යයේ නියැළීමට සූදානමින් පැමිණෙන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- ද්‍රව්‍ය ගුණ පරීක්ෂාවට කාර්ය 1.4හි දී ඇති ද්‍රව්‍ය සපයා ගෙන සිසුන්ට කාර්යයේ නියැළීමට සුදුසු වන සේ සඳහා කාර්ය පරිශ්‍ර සකසන්න.

කාර්ය 1.5

- කාර්ය 1.5හි නිරූපණය කෙරෙන තොරතුරු ගොනුවට අනුව අත්දැකීම් ලබාගෙන පන්ති කාමරයට පැමිණෙන ලෙස සිසුන්ට දන්වන්න.
- කාර්ය 1.5හි විවිධ ද්‍රව්‍ය හැසිරෙන ආකාරය පිළිබඳ සිසුන්ට පන්ති කාමරයේ දී අත්දැකීමෙන් දැනුම ලබා ගැනීමට සුදුසු වන සේ **Day 2** සඳහා කාර්ය පරිශ්‍ර සූදානම් කරන්න.

කාර්ය 1.6

සිසුන්ට නිරීක්ෂණය සඳහා බයිසිකලයක් සූදානම් කර තබන්න.

## 02 වන දිනය- කාර්ය 1.3/ කාර්ය 1.4/ කාර්ය 1.5/ කාර්ය 1.6

කාර්ය 1.3

- සිසුන් කාර්යයේ නියැළී ඇති බව තහවුරු කර ගැනීම සඳහා ඊට අදාළ ප්‍රශ්න කීපයක් සිසුන්ගෙන් අසන්න.
- කාර්ය 1.3හි පින්තූර රාමුව සැකසීමට ද්‍රව්‍ය තෝරා ගැනීමේ දී සිසුන් මුහුණ දුන් ගැටලු පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- නිවසේ දී සකසා නිම කරගෙන පැමිණි පින්තූර රාමු අතරින් කිහිපයක් පිළබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එහි දී ද්‍රව්‍ය තෝරා ගැනීම, නිර්මාණශීලී බව, නිමාව, වර්ණ ගැළපීම, උපදෙස් පිළිපැදීම වැනි කරුණු මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

කාර්ය 1.4

- ද්‍රව්‍ය ගුණ පරීක්ෂාවට කාර්ය 1.4හි දී ඇති ද්‍රව්‍ය සපයා ගෙන සිසුන්ට කාර්යයේ නියැළීමට සුදුසු වන සේ කාර්ය පරිශ්‍ර සකසන්න.
- කාර්ය 1.4ට අදාළ_තොරතුරු ගොනුව පරිශීලනයට සිසුන් යොමු කරන්න.
- දී ඇති උපදෙස් අනුව එක් එක් ද්‍රව්‍යවල ගුණාංග පරීක්ෂා කර ලබාගත් නිරීක්ෂණ මත පදනම් ව වගුව 1.1 සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරන්න.

කාර්ය 1.5

- කාර්ය 1.5ට අදාළ තොරතුරු ගොනුව පරිශීලනයට සිසුන් යොමු කරන්න.
- මොඩියුලයේ දී ඇති උපදෙස්වලට අදාළ ව පන්ති කාමරයේ දී ප්‍රායෝගික පරීක්ෂණ සිදු කරමින් අත්දැකීම් ලබා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**එදිනෙදා ජීවිතයට අවශ්‍ය තාක්ෂණික කාර්යන් ඉටු කිරීමේ දී ඇති වන ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා ලබා ගැනීමට මෙම ක්‍රියාකාරකමට අදාළ කාර්යන් උපකාර වන බව සිසුන්ට පැහැදිලි කරන්න.**

කාර්ය 1.6

කාර්ය 1.4/ කාර්ය 1.5 ඔස්සේ ලැබූ අත්දැකීම් පාසල තුළ දී කාර්ය 1.6 ප්‍රායෝගික ව සිදුකර පහත සංකල්පය සිසුන්ට තහවුරු කර ගැනීමට මග පෙන්වන්න.

**⋆⋆⋆ සංකල්පය - විවිධ කාර්යන් අනුව තෝරා ගන්නා ද්‍රව්‍ය වෙනස් වන බව**

## පෙර සූදානම - කාර්ය 1.7/ කාර්ය 1.8

කාර්ය 1.7

සරල ඉංජිනේරු කාර්යන් ආදර්ශනය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සපයා ගෙන සිසුන්ට අත්දැකීම් ලබා ගැනීමට **Day 3** සඳහා සරල ඉංජිනේරු කාර්යන් සිදු කිරීමට සුදුසු පරිදි කාර්ය පරිශ්‍ර සූදානම් කර තබන්න. මේ සඳහා පාසලේ වැඩ ඒකකයක් පවතී නම් එදිනට සුදුසු පරිදි එය සකස් කරන්න. අවශ්‍ය මෙවලම් නොමැති නම් විකල්ප භාවිත කරන්න. (නිවසින් ගෙන ආ හැකි මෙවලම් හා උපකරණ භාවිතය/ සම්පත් දායකයින්ගෙන් සපයා ගැනීම) අවශ්‍ය නම් සිසුන්ට මග පෙන්වීම සඳහා සම්පත් දායකත්වය ලබා ගැනීමට කටයුතු කරන්න.

කාර්ය 1.8

පෙර සූදානම

**Day 3**හි කාර්ය 1.8හි නිරත වීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන එන ලෙස සිසුන් දැනුවත් කරන්න. ඒ සඳහා හරස්කඩ 5cm x 5cm හා දිග 46cm ක් පමණ වූ ලී කුට්ටියක් තෝරා ගැනීමට සිසුන් ට උපදෙස් දෙන්න. එහි දී ඇල්බීසියා වැනි පහසුවෙන් කැපිය හැකි ලී වර්ගයක් තෝරා ගැනීම උචිත වේ. ලී වැඩපොළක් ආශ්‍රිත ව මෙවැනි ලී කුට්ටියක් පහසුවෙන් සපයා ගත හැකි වන අතර, එය ලබා ගැනීමේ දී එහි ප්‍රමාණය අඟල් 2x 2x18 (2”x 2”x 18”) ලෙස දැක්වීම යෝග්‍ය වේ.

කාර්ය 1.9/ කාර්ය 1.10

ද්‍රව්‍ය තේරීම, සරල ඉංජිනේරු කාර්යයන්ට හුරු කිරීම යනා දී තාක්ෂණ අවස්ථාවන්ට යොමුවක් ලැබෙන සේ කාර්ය 1.9හි දක්වා ඇති පරිදි නිෂ්පාදිතයක් සැකසීම සඳහා අදහසක් ලබා ගෙන **Day 3** සඳහා සූදානම් ව පැමිණීමට සිසුන් යොමු කරන්න.

## 3 වන දිනය

කාර්ය 1.7

- තොරතුරු ගොනුවේ පැහැදිලි කර ඇති සරල ඉංජිනේරු කාර්යන් පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට සිසුන් යොමු කරන්න.
- එක් එක් සරල ඉංජිනේරු කාර්යන් ආදර්ශනය කරන්න. ඒ ඔස්සේ ආවුද හා උපකරණ භාවිතය හා ආරක්ෂාකාරී පරිහරණය පැහැදිලි කරන්න.

- **කාර්ය 1.7ට අදාළ ව නිවැරදි ලෙස ආවුද හා උපකරණ ගබඩා කිරීම හා නඩත්තු කිරීම සඳහා හඳුන්වා දී ඇති, "සෙවණැලි පුවරුව" ඇසුරින් පාසලේ දී, නිවසේ දී, වැඩ ඒකකයක් තුළ දී පරිහරණය කරන ආවුද හා උපකරණ ක්‍රමානුකූල ව ගබඩා කර තැබීමේ වැදගත්කම මතු කරන්න.**
- **මේ ඔස්සේ සිසුන්ට S5 සංකල්පයට අනුව කටයුතු කිරීම සඳහා යොමුවක් ලබා දෙන්න.**
- **නිවසේ දී මෙම සංකල්පය දෙමාපියන් සමග ද බෙදා ගැනීමට උපදෙස් ලබා දෙන්න. ජීවන පුරුද්දක් ලෙස නිවසේ දී එය ක්‍රියාත්මක වන බව තහවුරු කර ගැනීමට සිසුන් සමග සාකච්ඡා කරන්න. හැකි නම් ඡායාරූපගතකර ගෙන්වා ගන්න.**

කාර්ය 1.8

- පියවර අනුගමනය කරමින් නිරූපණයේ දී ඇති සරල හැඩයන් තැනීම, තනි තනි ව ඉටු කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- නිවැරදි ව මැනීම් කර සලකුණු කිරීම පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කරන්න.
- ආවුද හා උපකරණ නිසි තාක්ෂණික ක්‍රම ශිල්පවලට අනුව භාවිතයට පුරුදු පුහුණුවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

කාර්ය 1.9

- නිෂ්පාදිත පිළිබඳ ව කණ්ඩායම් සාමාජිකයින්ගේ විවිධ අදහස් විමසා කණ්ඩායම් ක්‍රියාකාරකම ලෙස සැකසීමට වඩාත් සුදුසු නිෂ්පාදිතයට අදාළ නිර්මාණ සාරාංශය සැකසීමට යොමු කරන්න. (උදා: ලී පිංතූර රාමුව, බංකුව, පැන්සල් රඳවන, හැඳි රඳවන)
- වගුව 1.2ට අනුව නිෂ්පාදිතයේ එක් එක් කොටස් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය ගුණ පදනම් කරගෙන, නිෂ්පාදිතයට අවශ්‍ය ද්‍රව්‍ය තීරණය කිරීමට සිසුන් යොමු කරන්න.
- ඒ අනුව කණ්ඩායම විසින් නිෂ්පාදිතය සකස් කිරීමට පෙර (කාර්ය 1.11) නිර්මාණ සාරාංශය පිළියෙළ කිරීමට උපදෙස් දෙන්න.
- ඒ අනුව තම කණ්ඩායමට අවශ්‍ය ද්‍රව්‍ය තේරීමේ දී උදාහරණ වගුවේ දක්වා ඇති ද්‍රව්‍ය ගුණවලට අමතර ව එක් එක් කණ්ඩායමේ නිෂ්පාදිතයට අමතර ව වෙනත් ද්‍රව්‍ය ගුණ වුව ද සලකා බැලිය හැකි වේ.

කාර්ය 1.10

නිර්මාණය සෑදීමේ දී අවශ්‍ය වන සෑම පියවරක් මෙන් ම සෑම උපක්‍රමයක් ම ලැයිස්තුගත කිරීමට සිසුන් මෙහෙයවන්න. සමහර ආවුද පිළිබඳ අවබෝධය අඩු නම් මග පෙන්වීම සිදු කරන්න.

කාර්ය 1.11

- කාර්ය 1.10හි සැලසුමට අනුව කණ්ඩායම් නිර්මාණය සිදු කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සූදානම් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

පෙර සූදානම - කාර්ය 1.11

- කාර්යයෙහි නිරත වීමට ක්‍රියාකාරකම් කාමරය (පහසුකම් ඇත්නම්) කාර්ය 1.11 සඳහා සූදානම් කර ගන්න. වෙන් වූ ස්ථානයක් නොමැති නම් අවශ්‍ය සරල ඉංජිනේරු කාර්යන් සිදු කිරීමට සුදුසු පරිදි පන්ති කාමරය සකස් කරන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම සිදු කිරීම සඳහා කාර්ය පරිශ්‍රයක් සූදානම් කර තබන්න.
- අවශ්‍ය කරන ආවුද හා උපකරණ ලබා දීමට සැලසුම් කරන්න.

## 4 හා 5 වන දිනය

කාර්ය 1.11

- කාර්යයෙහි නිරත වීම සඳහා සිසුන් යොමු කරන්න.
- **S5 සංකල්පයට** අනුව යහපත් වැඩ පුරුදු (ක්‍රියාකාරකම 1 සඳහා සපයා ඇති ගුරු මාර්ගෝපදේශයේ ගුරු තක්සේරුකරණ වගුව - පිටුව 32 බලන්න.) අනුගමනය කරමින් කාර්යයේ නිරත වීමට උපදෙස් ලබා දෙන්න. එම යහපත් වැඩ පුරුදු ඉදිරි කාර්යන්වල දී ද අනුගමනය කිරීමට සිසුන් යොමු කරන්න.
- සැලසුම් කළ වැඩහල් කාර්යයන් හා උපකරණ භාවිත කර නිෂ්පාදිතය සාදා නිම කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කාර්යයේ නියැළීමේ දී මුහුණ දුන් ගැටලු හා විසඳුම් වගුව 1.9හි සඳහන් කිරීමට යොමු කරන්න.
- නිෂ්පාදිතය සකසා අවසන් වූ පසු සෑම කණ්ඩායමකට ම පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. ගුරු තක්සේරු නිර්ණායක පදනම් කර ගෙන සාකච්ඡාවට ලක් කරන්න.

## 6 වන දිනය

### ක්‍රියාකාරකම 1 - ගුරු තක්සේරුව

ක්‍රියාකාරකම 1ට අදාළ ව ගුරු තක්සේරුව සෑම කාර්යයක දී ම කළ යුතු අතර ඌන පූර්ණය හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. ක්‍රියාකාරකම අවසානයේ සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක් කර ප්‍රතිපෝෂණ ලබා දීම සිදු කරන්න.

### ක්‍රියාකාරකම 2 - පෙර සූදානම

කාර්ය 2.1

ක්‍රියාකාරකම 2 "රූපණ භාවිතයෙන් නිෂ්පාදිතයකට අගය එකතු කරමු" යටතේ සඳහන් තොරතුරු පරිශීලනය කර, පන්තියට පැමිණීමට පෙර ස්වයං ගවේෂණ කාර්ය 2.1 සම්පූර්ණ කර පන්ති කාමරයේ දී කළ හැකි නිර්මාණයක් පිළිබඳ අදහසක් මතු කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

කාර්ය 2.2

**Day 7**හි දී අපේක්ෂිත නිර්මාණය පන්ති කාමරයේ දී සැකසීමට සූදානමින් පැමිණෙන ලෙස සිසුන් දැනුවත් කරන්න.

# ක්‍රියාකාරකම 02

## රූපණ භාවිතයෙන් නිෂ්පාදිතයකට අගය එකතු කරමු

### 7 වන දිනය

කාර්ය 2.1

- කාර්ය 2.1 සාකච්ඡා කර පාඩමට පිවිසෙන්න.
- සාකච්ඡාවේ දී ඉස්මතු කළ යුතු කරුණු - අත්කම් නිෂ්පාදිතවල පරිසර හිතකාමීබව, ඒවා සාදා ඇති ද්‍රව්‍ය, ඒවායේ සුවිශේෂී විශේෂාංග (උදා - කැටයම්, වර්ණ ගැන්වීම්, වියමන් වෙනත් අත්කම් ක්‍රම)

**පෙර පරීක්ෂණය**

කාර්ය 2.2

තොරතුරු ගොනුව පරිශීලනය කර රටා මත පදනම වූ නිෂ්පාදිතයක් සැකසීමට අවස්ථාව ලබා දීමේ දී පහත පියවර අනුගමනය කරන්න.

1. තම අභිමතය පරිදි තෝරා ගත් රටාවක් නිදහස් අතින් ඇඳීමට යොමු කරන්න.
2. පාසලේ පරිගණක පහසුකම් භාවිත කර **M S Paint** මෘදුකාංගය ඇසුරින් එම රටාව ඇඳීමට යොමු කරන්න. අවශ්‍ය නම් සම්පත් පුද්ගල දායකත්වය ලබා ගන්න.
3. තමා අඳින ලද රටාව යොදා නිෂ්පාදිතයක් නිවසේ දී සැකසීමට යොමු කරන්න.
4. එළඹෙන දිනයේ දී පන්ති කාමරයේ දී එම නිර්මාණ අගයමින් කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.

පෙර සූදානම - කාර්ය 2.3

තොරතුරු ගොනුව පරිශීලනය කර සරල වියමනක පියවර පිළිබඳ ප්‍රායෝගික ව අත්දැකීම් ලබා ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන ඒමට සිසුන් දැනුවත් කරන්න.

### 8 වන දිනය

කාර්ය 2.3

- සරල වියමන් පියවර පුහුණුවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සරල වියමන් පුහුණු වීම ඔස්සේ ලබා ගත් දැනුම ඇසුරින් නිෂ්පාදිතයක් සැකසීමට යොමු කරන්න.
- නිවසේ දී නිෂ්පාදිතය සාදා නිම කර එළඹෙන දිනයේ දී පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් ව පැමිණෙන ලෙස උපදෙස් ලබා දෙන්න.

පෙර සූදානම - කාර්ය 2.4/ 2.5/ 2.6

කාර්ය 2.4

තොරතුරු ගොනුව නිවසේ දී අධ්‍යයනය කර නිර්මාණශීලී ඇසුරුම් සඳහා උදාහරණ රැගෙන එන මෙන් සිසුන්ට දන්වන්න.

කාර්ය 2.5

නිදහස් අතින් දළ රූප සටහන් ඇඳීමට හා වර්ණ ගැන්වීමට කඩදාසි හා පැන්සල් සපයා ගැනීමට සැලසුම් කරන්න.

කාර්ය 2.6

තිත් න්‍යාස කඩදාසි භාවිතය සඳහා මොඩියුලයේ දී ඇති තිත් න්‍යාස කඩදාසියෙන් එක් සිසුවෙකුට කඩදාසි කිහිපයක් සපයා ගැනීමට සැලසුම් කරන්න.

### 9 වන දිනය

කාර්ය 2.4

සිසුන් නිවසේ දී රැස් කළ තොරතුරු පන්තියේ දී සාකච්ඡා කරන්න. එහි දී පරිසර හිතකාමී නිෂ්පාදිතයන් ගේ අගය සිසුන්ට වටහා දෙන්න.

**කාර්ය 2.5**

නිදහස් අතින් දළ රූපසටහන් ඇඳීමට සරල භාණ්ඩයක් සපයන්න. සංකීර්ණ වස්තුවල දළ රූප සටහන් ඇඳ අත්හදා බැලීමට යොමු කරන්න.

**කාර්ය 2.6**

තිත් න්‍යාස කඩදාසි භාවිත කර ත්‍රිමාන වස්තු ඇඳීමට සිසුන් යොමු කරන්න. අවශ්‍ය අවස්ථාවන්හි දී මග පෙන්වීම් ලබා දෙන්න.

**කාර්ය 2.7**

- තොරතුරු ගොනු අධ්‍යයනය කර නිවසේ දී සිදු කිරීමට උපදෙස් ලබා දෙන්න.
- 3R සංකල්පය හඳුන්වා දෙන්න. (පරිසර හිතකාමී සංකල්පය සඳහා අනුගත වීමට)

**පෙර සූදානම - කාර්ය 2.8**

කාර්ය 2.8හි නිරත වීමට පෙර සූදානමින් පැමිණීමට සිසුන් යොමු කරන්න.
කාර්ය පරිශ්‍ර සූදානම් කර තබන්න.

## 10 වන දිනය

**කාර්ය 2.8**

මොඩියුලය ඔස්සේ ලත් සියලු අත්දැකීම් යොදා ගෙන කලාත්මක නිෂ්පාදිතයක් සෑදීමට අවස්ථාව ලබා දෙන්න.

★ ★ ★ **වාර අවසාන නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සූදානම් වීමට සිසුන්ට මග පෙන්වන්න.**
**ගුරු මාර්ගෝපදේශයේ පිටුව 10-11 නැවත පරිශීලනය කර වාර අවසාන නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සිසුන් දැනුවත් කර සැලසුම් කරන්න.**

**ක්‍රියාකාරකම 2 -**

**ගුරු තක්සේරුව**

ක්‍රියාකාරකම 2ට අදාළ ව ගුරු තක්සේරුව සෑම කාර්යයක දී ම කළ යුතු අතර ඌන පූර්ණය හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. ක්‍රියාකාරකම අවසානයේ සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක් කර ප්‍රතිපෝෂණ ලබා දීම සිදු කරන්න.

# ගුරු තක්සේරුව

## මොඩියුලය 2 - මූලික තාක්ෂණ හුරුව 1

තක්සේරු වගුවල සඳහන් කර ඇති නිර්ණායක පදනම් කර ගනිමින් සිසුන් විසින් කරනු ලබන කාර්ය පිළිබඳ ඇගයීම් කරන්න. ශිෂ්‍ය කාර්ය සාධනය විනිවිද භාවයකින් යුතු ව තක්සේරු කළ බව සහතික කරමින් එම ලකුණු සිසුන්ට ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 1 - මූලික වැඩහල් ක්‍රියාවලි ඉටු කරමු

| කණ්ඩායම් ලකුණු - 16 | | | | | |
|---|---|---|---|---|---|
| සාධන මට්ටම / නිර්ණායක | 4 | 3 | 2 | 1 | ලකුණු |
| කාර්ය 1.9 :<br>නිර්මාණ සාරාංශයේ අන්තර්ගත විය යුතු කරුණු<br>■ සුදුසු නමක් යෝජනා කිරීම<br>■ අවශ්‍යතාව හඳුනා ගැනීම<br>■ මිනුම් සහිත දළ සටහන<br>■ අවශ්‍ය ද්‍රව්‍ය හඳුනා ගැනීම<br>■ නව්‍යකරණ යෝජනා | කරුණු සියල්ල ම තෘප්තිමත් කරයි. | කරුණු 3-4ක් තෘප්තිමත් කරයි. | කරුණු 2ක් තෘප්තිමත් කරයි. | කරුණු 1ක් තෘප්තිමත් කරයි. | |
| කාර්ය 1.10 : වගුව 1.3<br>කාර්ය සඳහා ආවුද හා උපකරණ තෝරා ගැනීම | ආවුද හා උපකරණ 4ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් නිවැරදියි. | ආවුද හා උපකරණ 3ක් නිවැරදියි. | ආවුද හා උපකරණ 2ක් නිවැරදියි. | ආවුද හා උපකරණ 1ක් නිවැරදියි. | |
| කාර්ය 1.10 : වගුව 1.4 - වගුව 1.8 දක්වා වැඩ කොටස සඳහා සුදුසු ආරම්භක අමුද්‍රව්‍ය තෝරා ගැනීම<br>■ කොටස් ලැයිස්තුගත කිරීම<br>■ කොටස්වල අරමුණු දැක්වීම<br>■ ද්‍රව්‍ය නිවැරදි බව<br>■ නිවැරදි කොටස් මාන හා ද්‍රව්‍ය මාන<br>■ සහයෝගීත්වයෙන් කටයුතු කිරීම | කරුණු 4 ක් හෝ 5 ක් නිවැරදියි. | කරුණු 3 ක් නිවැරදියි. | කරුණු 2 ක් නිවැරදියි. | කරුණු 1 ක් නිවැරදියි. | |
| කාර්ය 1.11 :<br>ක්‍රියාකාරකම නිම කර ඇති මට්ටම<br>■ ක්‍රියානුරූපී බව<br>■ නිවැරදි හැඩ හා මාන<br>■ නිර්මාණාත්මක බව<br>■ නිවැරදි ව එකලස් කිරීම<br>■ නිෂ්පාදිතයේ පූර්ණ නිමාව<br>■ ගැටලුවලට පිළියම් යෙදීම | කරුණු 4ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සම්පූර්ණ කර ඇත. | කරුණු 3ක් සම්පූර්ණ කර ඇත. | කරුණු 2ක් සම්පූර්ණ කර ඇත. | කරුණු 1ක් සම්පූර්ණ කර ඇත. | |

| කේවල ලකුණු - 16 | | | | | |
|---|---|---|---|---|---|
| සාධන මට්ටම / නිර්ණායක | 4 | 3 | 2 | 1 | ලකුණු |
| කාර්ය 1.4 : වගුව 1.1<br>ද්‍රව්‍ය ගුණ පරීක්ෂාව<br>ද්‍රව්‍ය ගුණ පහ, ද්‍රව්‍ය පහක් සමග අත්හදා බැලීම | අවස්ථා 5ක් නිවැරදි ව සංසන්දනය කර ඇත. | අවස්ථා 3-4ක් නිවැරදි ව සංසන්දනය කර ඇත. | අවස්ථා 2ක් නිවැරදි ව සංසන්දනය කර ඇත. | අවස්ථා 1ක් නිවැරදි ව සංසන්දනය කර ඇත. | |
| කාර්ය 1.8 :<br>නිවැරදි සහ ආරක්ෂාකාරී ආවුද සහ උපකරණ භාවිතය | ඉහළ මට්ටමේ කුසලතාව සහ ආරක්ෂාව පෙන්නුම් කරයි. | කුසලතාව සහ නමුත් ආරක්ෂාකාරී විය යුතුයි. | කුසලතා දුර්වල නමුත් ආරක්ෂාකාරී ය. | මග පෙන්වීම් අවශ්‍යයි. | |
| යහපත් වැඩපුරුදු<br>S පහ සංකල්පවලට අනුව කාර්ය ක්‍රියාත්මක කර සම්පූර්ණ කිරීම<br>A. SORT - තේරීම<br>B. SET IN ORDER- කාර්ය පරිශ්‍රය සූදානම් කිරීම<br>C. SHINE- වැඩ ස්ථානය පිරිසිදු ව පිළිවෙළට තබා ගැනීම<br>D. STANDARDIZE- ආවුද සහ උපකරණ භාවිතයේ දී ආරක්ෂාකාරී ලෙස සම්මත පිළිපැදීම<br>E. SUSTAIN- ඉහත සඳහන් වැඩ පරිසරය, සියලු ක්‍රියාකාරකම් තුළ දී පවත්වා ගැනීම | කරුණු 4-5ක් සම්පූර්ණ කර ඇත. (ලකුණු 08) | කරුණු 3ක් සම්පූර්ණ කර ඇත. (ලකුණු 06) | කරුණු 2ක් සම්පූර්ණ කර ඇත. (ලකුණු 04) | කරුණු 1ක් සම්පූර්ණ කර ඇත. (ලකුණු 02) | |

# ක්‍රියාකාරකම 2 - රූපණ භාවිතයෙන් නිෂ්පාදිතයකට අගය එකතු කරමු

| කණ්ඩායම් ලකුණු - 04 | | | | | |
|---|---|---|---|---|---|
| සාධන මට්ටම / නිර්ණායක | 4 | 3 | 2 | 1 | ලකුණු |
| කාර්ය 2.6<br>නිෂ්පාදන ක්‍රමවේදය<br>• සුදුසු ද්‍රව්‍ය භාවිතය<br>• පරිසර හිතකාමී බව<br>• සුදුසු වර්ණ ගැන්වීමේ ක්‍රම භාවිතය<br>• කලාත්මක නිමාව | නිර්ණායක සියල්ල පූර්ණ කර ඇත. | නිර්ණායක 3ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 2ක් පූර්ණ කර ඇත. | නිර්ණායක 1ක් පූර්ණ කර ඇත. | |

| කේවල ලකුණු - 20 | | | | | |
|---|---|---|---|---|---|
| සාධන මට්ටම / නිර්ණායක | 4 | 3 | 2 | 1 | ලකුණු |
| කාර්ය 2.1<br>සාම්ප්‍රදායික කලාත්මක නිර්මාණය ඇගයීමේ දී හඳුනා ගත යුතු කරුණු<br>▪ වැදගත් විශේෂාංග දැක්වීම<br>▪ සාදා ඇති ද්‍රව්‍ය හඳුනා ගැනීම<br>▪ පැහැදිලි දළ සටහන් ඇඳීම<br>▪ පරිසර හිතකාමී වන ආකාර දැක්වීම | කරුණු සියල්ල ම හඳුනා ගෙන ඇත. | කරුණු 3ක් හඳුනා ගෙන ඇත. | කරුණු 2ක් හඳුනා ගෙන ඇත. | කරුණු 1ක් හඳුනා ගෙන ඇත. | |
| කාර්ය 2.2<br>රටා නිර්මාණය<br>▪ විභව භාවිත හඳුනා ගැනීම<br>▪ අවශ්‍ය ද්‍රව්‍ය හඳුනා ගැනීම<br>▪ උචිත ක්‍රමවේද භාවිතය<br>▪ සුදුසු වර්ණ භාවිතය | කරුණු සියල්ල ම අඩංගු කර ඇත. | කරුණු 3ක් අඩංගු කර ඇත. | කරුණු 2ක් අඩංගු කර ඇත. | කරුණු 1ක් අඩංගු කර ඇත. | |

| සාධන මට්ටම / නිර්ණායක | 4 | 3 | 2 | 1 | ලකුණු |
|---|---|---|---|---|---|
| කාර්ය 2.3<br>වියමන සඳහා උචිත ශිල්ප ක්‍රම හඳුනා ගෙන භාවිත කිරීම<br>▪ සුදුසු ද්‍රව්‍ය භාවිතය<br>▪ නිර්මාණාත්මක රටා භාවිතය<br>▪ නිසි වර්ණ සංකලනය<br>▪ කලාත්මක නිමාව | කරුණු සියල්ල ම පූර්ණ කර ඇත. | කරුණු 3ක් පූර්ණ කර ඇත. | කරුණු 2ක් පූර්ණ කර ඇත. | කරුණු 1ක් පූර්ණ කර ඇත. | |
| කාර්ය 2.5<br>සංකල්පය සඳහා දළ රූප සටහන් ඇඳීම<br>▪ විස්තරාත්මක වීම<br>▪ පරිමාණයට අනුව ඇඳීම<br>▪ අදාළ ලෙස පැති අඳුරු කිරීම හා ත්‍රිමාන බව පෙන්වීම<br>▪ පැහැදිලි වීම | කරුණු සියල්ල ම පූර්ණ කර ඇත. | කරුණු 3ක් පූර්ණ කර ඇත. | කරුණු 2ක් පූර්ණ කර ඇත. | කරුණු 1ක් පූර්ණ කර ඇත. | |
| කාර්ය 2.6<br>දළ රූප සඳහා නිවැරදි ශිල්ප ක්‍රම හඳුනා ගෙන භාවිත කිරීම<br>▪ විස්තරාත්මක වීම<br>▪ පරිමාණයට අනුව ඇඳීම<br>▪ අදාළ ලෙස පැති අඳුරු කිරීම හා ත්‍රිමාන බව<br>▪ පැහැදිලි ව රේඛා සටහන් ඇඳීම | කරුණු සියල්ල ම පූර්ණ කර ඇත. | කරුණු 3ක් පූර්ණ කර ඇත. | කරුණු 2ක් පූර්ණ කර ඇත. | කරුණු 1ක් පූර්ණ කර ඇත. | |